# බොදු මිතු අරුණ

## Light of Buddhist Friendship

2565 වන සම්බුද්ධත්ව ජයන්තිය



# මහ කොමසාරිස්තුමාගේ වෙසක් දින පණිවුඩය



හිතවත් සහෝදර සහෝදරියනි,

බුදුන් වහන්සේගේ උපත, බුදුවීම සහ පරිනිර්වාණය සමරන උතුම් වෙසක් පොහෝ දිනය නිමිත්තෙන්, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සියවස් ගණනාවක් පැරණි බොදු උරුමයෙහි විවිධ පැතිකඩ ආවරණය කෙරෙන විශේෂ අතිරේකයක් පළ කිරීම සම්බන්ධයෙන් මම අතිශයින් සතුටට පත් වෙමි.

ශතවර්ෂ ගණනාවක් පුරා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින බොදු සබඳතා අපගේ ද්විපාර්ශවික සහයෝගීතාවයේ ඉතා වැදගත් ස්ථානයක් හිමි කර ගෙන ඇත. බුදුන් වහන්සේ ජීවමාන කාලය දක්වා දිවයන මෙම බැඳීම් ධාතු ප්‍රදර්ශන සහ බොදු උරුමයන් සුරැකීම ආදි විවිධ මානයන් ඔස්සේ පැතිර පවතී. බෞද්ධ විහාරාරාම ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සහ භික්ෂූන් වහන්ස්ලා අතර සහයෝගීතාවය ඉහළ නැංවීම ඇතුළු ක්ෂේත්‍ර ඔස්සේ මෙම සබඳතා වඩා ශක්තිමත් කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 15ක ප්‍රදානයක් ලබා දෙන බව අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2020 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශ කළේය.

මෑත කාලයේදී, දෙරටෙහි නායකයන් උතුම් වෙසක් දිනය නිමිත්තෙන් එක්ව කටයුතු කර ඇත. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2017 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ පැවති එක්සත් ජාතීන්ගේ 14 වන වෙසක් දින උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා නව දිල්ලි නුවර ජාත්‍යන්තර බෞද්ධ සම්මේලනය විසින් සංවිධානය කරනු ලබන වෙසක් සැමරුම් උත්සවය ආමන්ත්‍රණය කිරීම අපට ගෞරවයකි. අග්‍රාමාත්‍යතුමා සහ තවත් ලෝක නායකයන් රැසක් මෙම උත්සවය අමතනු ඇත.

අප විසින් බුදුන් වහන්සේ මනුෂ්‍යාත්වය කෙරෙහි දැක්වූ දයානුකම්පාව සහ කැපවීම සමරන මෙම අවස්ථාවේදී ලෝකය ගෝලීය වසංගතය විසින් මතු කර ඇති පෙර නොවූවිරූ අභියෝගයන් සමඟ සටන් කරමින් සිටියි. බුද්ධ රත්නයේ ආශිර්වාදයෙන් සියලු ලෝ වාසීන් නිදුක් වෙත්වා!

ඔබ සැමට පින්බර වෙසක් පොහෝ දිනක් ප්‍රාර්ථනා කරන අතර ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර පවතින සබඳතාවය දිනෙන් දින ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කරමි.

මෙත් සිතින්,


**ගෝපාල් බාග්ලේ**

**ඉන්දීය මහ කොමසාරිස්**



ඉන්දියාව කියනවාට වඩා බෞද්ධ ජනතාව දඹදිව නමින් වහරන්නට කැමැත්තක් ඇත්තේද ඉන්දියාව බුදුරජාණන් වහන්සේගේ ජන්ම භූමිය වීමත් බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් රාශියකට දේශය වූයේ දඹදිව හෙවත් භාරතය නිසාත්ය...මේ නිසා ඉන්දියාව සහ ලංකාව අතර අතීතයේ සිට වර්තමානය දක්වා විවිධ සබඳතා පැවති අතර බෞද්ධ ජනතාව සමඟ ඇති සම්බන්ධය සෘජුවම බුද්ධ චරිතය සමඟ බැඳී තිබේ”

*- පූජ්‍ය බටුවන්ගල රාහුල හිමි*



“දීර්ඝ ඉතිහාසයක් ඇති ඉන්දියා - ශ්‍රී ලංකා මිත්‍රත්වය සදාකල් රැකේවායි ප්‍රාර්ථනය කරන අතර, වර්තමානයේ දරුණු වසංගතයකට මුහුණ දෙමින් සිටින ඉන්දියාවටත්, මගේ මව් රටටත් මුළුමහත් ලෝකවාසීන්ටත් තුණුරුවන්ගේ ආශිර්වාදයෙන් මෙම වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයේදී ආශිර්වාද ලැබේවායි ප්‍රාර්ථනය කරමි”

*- පූජ්‍ය බානගල උපතිස්ස හිමි*



## "බෞද්ධ ලෝකයේ කේන්ද්‍රස්ථානය" - බුද්ධගයාවේ මහාබෝධි විහාරය

මෙය සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් ස්ථානයේ ඉදි කර ඇත. මෙය බෞද්ධයන් විසින් වැඳ පුදා ගත යුතු සතර මහා ස්ථානයන්ගෙන් එකකි. වර්තමානයේ දක්නට ලැබෙන විහාරය ක්‍රි.ව. පස්වන සියවස මැද දී පමණ ඉදි කර ඇත. බිහාරයේ පිහිටා ඇති මෙය යුනෙස්කෝ ලෝක උරුමයක් ද වේ.




2018 වෙසක් උත්සවය නිමිත්තෙන් පැවති සාරානාත් ධාතු ප්‍රදර්ශනය



# “බුදු දහමෙන් පෝෂණය වූ ශ්‍රී ලංකා - ඉන්දියා අසිරිමත් මිතුදම ”

ආචාර්ය මාඉටිපේ විමලසාර මහා ස්ථවිර



ලොව්තුරා බුදුරාජාණන් වහන්සේගේ අසිරිමත් තෙමඟුල සිහිපත් කෙරෙන මේ උතුම් වෙසක් පුර පසළොස්වක පොහෝ දින සිරිලක සහ භාරතය යන උතුම් ධාර්මික දෙරට අතර පැවතුණු සහ පවතින අනභිභවනීය ඉතිහාස වංශ කථාවෙන් හෙළිදරව් වන මෙම අසල්වැසි රටවල් දෙක අතර බුදු දහමේ සබැඳියාවෙන් ගොඩනැගුණු ශ්‍රේෂ්ඨ මිතුදම කවරේ ද යන්න විශ්ලේෂණය කර විමසා බැලීම කාලෝචිතය. බුදුරජාණන් වහන්සේ සිරිලකට තෙවරක් ම වැඩම කරවීම, අශෝක අධිරාජයාගේ සුවිශාල ජාත්‍යන්තර බෞද්ධ ධර්ම ප්‍රචාර සේවාවේ උත්තුංග ප්‍රතිඵලයක් ලෙස අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ ධර්මදූත මෙහෙවර, ජය ශ්‍රී මහා බෝධි ශාඛාවක් ද සමඟ සඟමිත් තෙරණියන්ගේ වැඩම කරවීම, කිත්සිරිමෙවන් රජ දවස භාරතයේ සිට හේමමාලා කුමරිය සහ දන්ත කුමරු දෙපළ විසින් අති උත්තම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ සිරිලකට වැඩම කරවීමෙන් බිහිවුණු විශ්ව සංස්කෘතිය, පාලි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සහ අටුවා ටීකා බිහි කිරීම යනාදී ඓතිහාසික සන්ධිස්ථාන පසුකරමින් ගොඩනැගුණු ඉන්දු ශ්‍රී ලංකා මිත්‍ර සබඳතාවේ ප්‍රෞඪ ඉතිහාසය සාඩම්බරයෙන් සිහිපත් කිරීමෙන් අනතුරුව අවධානය යොමුවිය යුත්තේ 19 වන සියවසේ අගභාගයේ දී යළිත් වතාවක් ඇති වූ ඉන්දු ශ්‍රී ලංකා සබඳතාව වඩාත් ශක්තිමත් වීම සම්බන්ධවයි.

19 වන සියවස බෞද්ධ පුනරුදයේ අතිශයින් ම වැදගත් යුගයක් බවට ඉතිහාසය සාක්ෂි දරයි. මෙම ඉතිහාසගත කරුණු අතරින් 1891 වසරේ දී ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා විසින් ජාත්‍යන්තර බෞද්ධ සංවිධානයක් වන මහාබෝධි සමාගම පිහිටුවාලීම සහ මෙම වසරේදී ම භාරතයේ බෞද්ධ ප්‍රබෝධයේ පුරෝගාමී බෞද්ධ නායකයෙකු වන භාරතරත්න ආචාර්ය බාබා සාහබ් භීම් රාඕ අම්බෙඩ්කාර් තුමන්ගේ උපත සිදුවීම ද සමකාලීන වැදගත් සංසිද්ධියක් වේ.

ඉන්දු - ශ්‍රී ලංකා බෞද්ධ මිතුදම අතිශයින් වර්ණවත් කළ චරිත ලෙස ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමන් සහ ආචාර්ය භීම් රාඕ අම්බෙඩ්කාර් තුමන් ඉතිහාසගත වී සදාඅනුස්මරණීය යුග පුරුෂයින් ලෙස සදා අභිවන්දනයට ලක්වනු ඇත.



මෙම වටිනා ඉතිහාසය ගොඩනැගීමේ දී මතුවන චරිත අතරින් පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර මා හිමිපාණන් වහන්සේ, පූජ්‍ය සිකීම් මහින්ද මා හිමිපාණන් වහන්සේ, පූජ්‍ය මහා පණ්ඩිත රාහුල් සන්ක්‍රිටියායන් මා හිමිපාණන් වහන්සේ, පූජ්‍ය ආචාර්ය භදන්ත් ආනන්ද කෞශල්‍යායන් මා හිමිපාණන් වහන්සේ මෙන්ම පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මා හිමිපාණන් වහන්සේ සමඟින් අත්වැල් බැඳගත් කල්කටා විශ්වවිද්‍යාලයේ උපකුලපති පදවිය ඉසිලූ ආචාර්ය අසතෝෂ් මුකර්ජී යන සුවිශේෂී චරිත මෙම රටවල් දෙක අතර මිතුදම ගොඩනැගීමේ දී බිහිවුණු ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ය.

ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමන් 1891 දී ආරම්භ කරන ලද මහාබෝධි සංගමය කල්කටා නගරය මුල්කර ගනිමින් භාරතීය බෞද්ධ ප්‍රබෝධයේත් එමඟින් ලෝක බෞද්ධ ප්‍රබෝධයේත් ධර්මදූත සේවාවන් හි නිරත වන යුගයේදී ම 1892 වර්ෂයේ දී කල්කටා නගරයේ දී බිහිවුණු රාමක්‍රිෂ්ණ මිෂන් යන ප්‍රකට ධාර්මික සංස්ථාව බිහිකළ ස්වාමි විවේකානන්ද තුමන් සමඟින් බිහිවුණු වැදගත් මිතුදම ඉන්දු - ශ්‍රී ලංකා බෞද්ධ සුහදතාවය වඩා වර්ධනය කිරීමට තවත් සාධකයක් විය. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් සහ ස්වාමි විවේකානන්ද තුමන් 1893 වර්ෂයේ දී ඇමරිකාවේ චිකාගෝ නුවර පැවති ලෝක දෘෂ්ටි සම්මේලනය අමතා පවත්වන ලද බුදු දහම සහ හින්දු දහම පිළිබඳ දේශනයන් තුළින් බටහිර ලෝකය අවදි වූ බව පෙනේ. එමෙන්ම 1892 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද මහාබෝධි ඉංග්‍රීසි සඟරාවෙන් ද සාර්ථක ප්‍රතිඵල ඇති වූ බව ඉතිහාසය සාක්ෂි දරයි. මෙම සෑම ක්‍රියාවකින් ම වර්ධනය වූයේ බුදුදහමෙන් පෝෂණය වූ ඉන්දු - ශ්‍රී ලංකා මිතුදම යි.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් 1933 වර්ෂයේ දී සිරි දේවමිත්ත ධර්මපාල ස්වාමීන් වහන්සේ ලෙසින් අපවත් වීමෙන් අනතුරුව මහාබෝධි සමාගමේ බර කරටගත් දේවප්‍රිය වලිසිංහ මැතිතුමන් සහ භාරතරත්න භීම් රාඕ අම්බෙඩ්කාර් තුමන් අතර ගොඩනැගුණු මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස 1950 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට ආචාර්ය අම්බෙඩ්කාර් තුමන්ගේ පැමිණීම සහ දළදා මාලිගා පරිශ්‍රයේ පැවති ලෝක බොදු සමුළුවට සහභාගී වී කරන ලද දේශනය ඉන්දු - ශ්‍රී ලංකා බොදු මිතුදමේ තවත් වැදගත් සංධිස්ථානයකි.



1956 වසර සමස්ත ලෝක බෞද්ධ ප්‍රජාවට ම අතිශයින් වැදගත් වසරකි. 2500 බුද්ධ ජයන්තිය ලොවපුරා ඉමහත් ගෞරවයෙන් සැමරූ මෙම වර්ෂයේ දී ආචාර්ය භීම් රාඕ අම්බෙඩ්කාර් තුමන් ලක්ෂ ගණනක් අනුගාමිකයින් සමඟ ත්‍රිවිධ රත්නයේ සරණ යමින් බෞද්ධ උපාසකයෙකු බවට පත්වීම ඉන්දු - ශ්‍රී ලංකික බෞද්ධ මිත්‍රත්වයේ තවත් සන්ධිස්ථානයකි. 2500 සම්බුද්ධත්ව ජයන්තිය සමරන අවස්ථාවේ දී ඉන්දියානු රජය, ශ්‍රී ලාංකික වන්දනාවේ යන බැතිමතුන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය පිණිස නවදිල්ලි නගරයෙහි ප්‍රධාන දුම්රියපොළ ඉදිරිපිට බිම්කඩක් පරිත්‍යාග කරමින් ශ්‍රී ලංකා බෞද්ධ විශ්‍රාම ශාලාව නිර්මාණය කිරීමට දක්වන ලද සහයෝගය තුළ දෙරටේ සැබෑ මිත්‍රශීලී බව ප්‍රකට කරනු ලැබීය.

එක් අතකින් ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා භාරතය පුරාම මහාබෝධි සමාගම, ආනන්ද මහා බෝධි සමාගම සහ මහා මහින්ද ධර්මදූත සමාගම මුල් කරගනිමින් පාඨශාලාවන් නිර්මාණය කරමින් බෞද්ධ වෙහෙර විහාර ඇති කරමින් ඉන්දීය ජනතාවට සමාජ සුබදායක මෙහෙවරයන් රැසක් සිදුකළ මෙම යුගයේ දී තවත් අතකින් ආචාර්ය භීම් රාඕ අම්බෙඩ්කාර් තුමන් ඉන්දීය ජනතාවට බුදු දහම හඳුන්වා දෙමින් කරන ලද සුවිශේෂී මෙහෙවර තුළින් ද වඩා වර්ධනය වූයේ ඉන්දු - ශ්‍රී ලංකා බෞද්ධ මිතුදමයි.

මෙම මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස දහස් ගණනක් ශ්‍රී ලාංකික උසස් අධ්‍යාපනයේ නිරත වන භික්ෂූන් වහන්සේලාටත් ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් ඉන්දීය විශ්ව විද්‍යාලයන්හි සහ උසස් අධ්‍යාපනය ලබාදෙන ආයතනයන් හි අධ්‍යාපනය ලබාගැනීමට ඉන්දීය මධ්‍යම රජය යටතේ පාලනය වන ICCR යනුවෙන් හඳුන්වනු ලබන Indian Council for Cultural Relations හරහා ලබාදෙන ලද ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව ඉන්දු - ලංකා මිත්‍රත්වය ගොඩනැගීමට මෙන්ම පවත්වා ගෙන යාමට හේතුවන තවත් වැදගත් කරුණක් ලෙස සඳහන් කළ හැක. එමෙන්ම 2017 වසරේ දී ශ්‍රී ලංකාවේ පැවැත්වුණු 14 වන අන්තර්ජාතික වෙසක් උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි තුමන්ගේ සම්ප්‍රාප්තිය සිදු වීම ද මෙම වකවානුවේ දී සිදු වූ තවත් වැදගත් සිදුවීමකි.




බුදුපියාණන් වහන්සේගේ සමයේ සිට අදවනතුරු රැකගෙන ආ මෙම සුහදශීලී ධාර්මික මිත්‍ර සබඳතාවය, විශ්වසනීය මිත්‍රශීලීබව මතු පරම්පරාවට ආරක්ෂා කරදීම අපගේ යුතුකමක් වන අතර ඒ තුලින් පෝෂණය වන්නේ ද ආරක්ෂා වනුයේ ද උතුම් ශ්‍රී සම්බුද්ධ ශාසනය මෙන්ම ඉන්දු - ශ්‍රී ලංකා අද්විතීය මිත්‍රත්වයයි.

**ආචාර්ය මාඉටිපේ විමලසාර මහා ස්ථවිර**

**විහාරාධිපති / අධ්‍යක්ෂ - පරම ධම්ම චෛතිය පිරිවෙණ, රත්මලාන**

**උප සභාපති - ලෝක බෞද්ධ සංඝ සම්මේලනය**



# සාංචි මහා ස්ථූපය

මධ්‍ය ප්‍රදේශ් හි සාංචි මහා ස්ථූපය - සාංචි මහා ස්ථූපය අද දක්වා පවතින ශ්‍රේෂ්ඨතම පෞරාණික බෞද්ධ ස්ථූපය වේ. එය සාංචි හි කඳු මුදුනක ඉදිකර ඇත. මුල් ස්ථූපය ක්‍රි. පූ. තුන් වන සියවසේදී ඉදිකර ඇති අතර ක්‍රි. පූ. දෙවන සියවස මැද දී එහි විශාලත්වය දෙගුණයකින් වැඩි කර ඇත. අඩි 34 බැගින් වන විචිත්‍රවත් කැටයම් සහිත තොරණ 4ක් ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසේදී එක් කර ඇත. දෙපැත්තේම ඉදි කර ඇති විභූතිමත් ද්වාරයන් විශිෂ්ටතම බෞද්ධ කලා නිර්මාණයකි. සාංචි මහා ස්ථූපය යුනෙස්කෝ ලෝක උරුමයක් ද වේ.



# ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා : බෞද්ධ සාධකය

**සේවාර්ජිත මහාචාර්ය අසංග තිලකරත්න**

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සබඳතා ඉපැරණි ද බහුවිධ ද වේ. ක්‍රිස්තු පූර්ව යුගයේ සිට අඛණ්ඩව පැවත ඇති මෙම සබඳතා ආගමික සහ සංස්කෘතික මෙන්ම ආර්ථික හා දේශපාලනික ද වේ. ශ්‍රී ලංකාවෙහි සාම්ප්‍රදායික විශ්වාසය අනුව දිවයින ජනාවාස කොට ඇත්තේ ඉන්දියාවෙන් පැමිණි විජය කුමරු ඇතුළු පිරිසකගෙනි. මෙම සිද්ධියෙහි ඓතිහාසිකත්වය කෙසේ වෙතත්, අසල්වැසි රටෙහි විවිධ ප්‍රදේශවලින් ජනතාව විවිධ අවස්ථාවල දී මෙහි පැමිණ පැළපැදියම් වූ බව සිතිය හැකිය. එහෙත් එසේ ජනකොටස් ඉන්දියාවෙන් පැමිණීම මේ රටෙහි ආදි ඉතිහාසයෙහි තීරණාත්මක සාධකයක් වුවත්, එසේ සිදු වීමට පෙර ශ්‍රී ලංකාව ජනශූන්‍ය ප්‍රදේශයක් වූ බවක් ඉන් ගම්‍ය නොවේ.

ඓතිහාසිකව තහවුරු කළ හැකි ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා ආරම්භ වනුයේ බුදුදහම ඇසුරු කොටගෙනය. ක්‍රි. පූ. 3 වන සියවසෙහි ඉන්දියාවේ අශෝක අධිරාජයාගේ දවස ලංකාවේ දේවානම්පිය තිස්ස රජුගේ කාලයෙහි සිදුවූ මහින්දාගමනය හෙවත් අශෝක රජුගේ පුත් මිහිඳු හිමියන් ප්‍රධාන භික්ෂූන් වහන්සේ විසින් බුදුසසුන දිවයිනට ගෙනවිත් පිහිටුවීම අද දක්වාත් අඛණ්ඩව පවත්නා ආගමික හා සංස්කෘතික ප්‍රවාහයක ආරම්භය සනිටුහන් කරයි. මහින්දාගමනය හුදෙක් ආගමික කාර්යයක්ම නොව ශ්‍රී ලංකා ජන ජීවිතය කෙරෙහි අද දක්වාත් බලපෑම් කරන ප්‍රධාන සංස්කෘතික සාධකය බව පැහැදිලි කරුණකි.

මහින්දාගමනයෙන් ලංකාවට හඳුන්වාදෙන ලද ථේරවාද බුදුසමය ක්‍රමයෙන් දිවයිනෙහි මුල් බැසගෙන ප්‍රධාන ආගමික ධාරාව බවට පත් වූ අයුරු මහාවංසාගත ඉතිහාසයෙන් පැහැදිලි වේ. සියවස් කීපයක් ඇතුළත දී ශ්‍රී ලංකාව ථේරවාද බෞද්ධ සම්ප්‍රදායයෙහි මූලස්ථානය බවට පත් විය. ක්‍රිස්තු වර්ෂාරම්භයෙහි දී වළගම්බා රජු දවස ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කරන ලද බව මහාවංසයෙහි සඳහන් වේ. මෙම ප්‍රවෘත්තියෙහි ඓතිහාසිකත්වය සැක කිරීමට හේතුවක් නැති අතර, බෞද්ධ ඉතිහාසයෙහි අතිශයින් තීරණාත්මක වූ මෙම සිද්ධියෙන් ස්ථාවර බෞද්ධ සාහිත්‍යයක මුදුන් පැමිණීම සිදු වූවා පමණක් නොව ථේරවාද බෞද්ධ ලෝකයෙහි අවධානය ලංකාව කෙරෙහි යොමු වීමට ද එය හේතු වූ බව පෙනේ.

ථේරවාද සම්ප්‍රදාය යනු මූලික වශයෙන් ම ත්‍රිපිටක ධර්මය හෙවත් බුද්ධ දේශනාව හා එය අර්ථකථනය කරන සම්ප්‍රදාය ලෙස ගතහොත් ඉන්දියාවෙන් මේ රටට ලැබුණු ධර්ම දායාදය සුරක්ෂිත කොට පෝෂණය කිරීමේ කාර්යය ශ්‍රී ලංකාවේදී ඉතා හොඳින් සිදු වූ බව පෙනේ. ථේරවාද අර්ථකථන සම්ප්‍රදාය ආරක්ෂා වී පවතින්නේ බුද්ධඝෝෂ හිමියන් ප්‍රධාන අටුවාචාරීන්වහන්සේලාගේ දායකත්වය හේතුවෙනි. මුලින් ම මහින්දාගමනයත් සමඟ දිවයිනට ලැබුණු මෙම සම්ප්‍රදාය ශ්‍රී ලාංකික භික්ෂූන් විසින් දීපභාසාවෙන් හෙවත් සිංහල භාෂාවෙන් ප්‍රගුණ කළ අතර මහා අට්ඨකථා, මහා පච්චරී අට්ඨකථා හා කුරුන්දි අට්ඨකථා යන නම් වලින් සඳහන් වන්නේ එම සිංහල කෘතිය. ශ්‍රේෂ්ඨතම පාලි අර්ථකථාචාර්යවරයා ලෙස සලකනු ලබන බුද්ධඝෝෂ හිමියන් සහ බුද්ධදත්ත, ධම්මපාල වැනි හිමිවරුන් විසින් මහා විහාරය ආශ්‍රිතව වෙසෙමින් පාලි භාෂාවට නඟා සකස් කරන ලද්දේ මෙම සිංහල අර්ථකථා සම්ප්‍රදාය වේ. ඉන්දියාවෙන් පැමිණි බුද්ධඝෝෂ ආදි හිමිවරුන් විසින් එම කෘති පාලි භාෂාවට නඟා නැවතත් ඉන්දියාවට ගෙන යාම දෙරට අතර සිදු වූ ආගමික හා සංස්කෘති සබඳතා පිළිබඳ ඉතා ප්‍රබල සාක්ෂ්‍යයක් වේ. දහ වන ශතවර්ෂයෙන් පමණ පසු ඉන්දියාවෙන් බුදුසමය අභාවයට පත් වුව ද එහි ඇති වූ මහායාන බුදුසමය ඉන්දියාවෙන් උතුරුදිග ප්‍රදේශ හරහා චීනය ඇතුලු

නැගෙනහිර ආසියාතික රටවල ද, වජ්‍රයාන බුදුසමය තිබ්බතය,භූතානය, සිකීම් ආදී කඳුකර ප්‍රදේශ වල ද, ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය ලංකාවෙහි ද, ලංකාවෙන් බුරුමය, තායිලන්තය ආදි අග්නිදිග ආසියාතික රටවල ද අද දක්වාත් ආරක්ෂා වී පැවතීම බුදුදහම මුල් කොට ගෙන ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පමණක් නොව ඉන්දියාව හා සමස්ත ආසියාවේ විශාල ප්‍රදේශයක් තුළ ඉන්දීය ආගමික හා සංස්කෘතික සබඳතා බලපැවැත්වූ හා අද දක්වාත් බලපවත්වන ආකාරය පිළිබඳ නිදසුන් වේ.

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර බෞද්ධාගමික සබඳතා යටත්විජිත සමය තෙක් ම පැවති බවට සාධකයක් නම් කෝට්ටේ යුගයෙහි දී, එනම් , 15 වන සියවසෙහි දී රාමචන්ද්‍ර කවිභාරතී නම් ඉන්දියානු බ්‍රාහ්මණ පඬිවරයාගේ ලංකාගමනයයි. එවකට ලංකාවේ වැඩ සිටි අග්‍රගණ්‍ය පැවිදි උගතා වූ තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජයන්වහන්සේ හමු වූ මෙම භාරතීය විද්වතා පිළිබඳ මතකය එම විහාරස්ථ භික්ෂූන්වහන්සේ අතර නොමැකී පැවති අයුරු 1909 දී හෙවත් විසිවන සියවස ආරම්භයෙහි ලංකාවට පැමිණ විද්‍යෝදය පිරිවෙණාධිපති හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් වෙතින් පාලි භාෂාව හා බුදුදහම හදාළ සතිශින්ද්‍ර විද්‍යාභූෂණ පඬිවරයා විසින් තම History of Indian Logic (1920) නම් කෘතියෙහි සඳහන් කොට ඇත. විද්‍යෝදය පිරිවෙණට පැමිණි එම විද්වතා මෙන් ම තවත් බෙහෝ ඉන්දියානු විද්වතුන් බෞද්ධ ධර්මඥානය ලබා ගනු වස් මෙහි පැමිණි බව පෙනේ. එබඳු විද්වතුන් අතර පැළියගොඩ විද්‍යාලංකාර පිරිවෙණට පැමිණ එහි ධර්මශාස්ත්‍රය හදාරමින් ආචාර්ය ධුර ද දරමින් ක්‍රියා කළ රාහුල සංකෘත්‍යායන හා ආනන්ද කෞශල්‍යායන හිමියන් ද, විද්‍යාලංකාර පිරිවෙණට පැමිණ එහි දී පැවිද්ද ලබා ධර්මය ඉගෙන පසුව ඉන්දියාවේ නව නාලන්දා මහා විහාර නම් වූ විද්‍යාස්ථානය පිහිටුවීමේ පුරෝගාමී වූ ජගදීශ කාශ්‍යප හිමියන් ද මෑත යුගයෙහි ඉන්දීය - ශ්‍රී ලංකා සබඳතාවල ඉතා පුළුල් සාධක ලෙස දැක්විය හැකිය.

ඉන්දීය හා ශ්‍රී ලංකා ආගමික සබඳතා පිළිබඳව කිසිසේත්ම මෙබඳු කෙටි සටහනකින් ප්‍රමාණවත්ව දැක්විය නොහැකි වුව ද මෙම සාකච්ඡාව අසම්පූර්ණ නොවීම සඳහා තවත් පුද්ගලයන් දෙදෙනෙකු පිළිබඳව සඳහන් කළ යුතුය. ඉන් පළමුවැන්නා නම් නූතන යුගයෙහි බුදුසමය ඉන්දියාවට හඳුන්වාදීමේ පුරෝගාමි මෙහෙවර ඉටු කළ අනගාරික ධර්මපාල තුමාය. ඉන්දියාවේ මහා බෝධි සමාගම ආරම්භ කරමින් එහි බෞද්ධ උරුමය ලෝකයා වෙත විවර කිරීමේ ගෞරවය ධර්මපාල තුමාට හිමි වේ. දෙවැන්නා නම් නූතන ඉන්දියානු බුදුසමයේ පුරෝගාමියෙකු වූ “නවයාන” යනුවෙන් බෞද්ධ සම්ප්‍රදායක් බිහිකොට ලක්ෂ පහකට අධික තම අනුගාමික ජනතාවක් සමඟ 1956 හි බුදුදහම වැළඳ ගත් නිදහස් ඉන්දියාවේ නීතිය පිළිබඳ පළමුඅ වන අමාත්‍යවරයා වූ භීම් රාඕ අම්බෙඩ්කාර් මැතිතුමාය. එතුමා 1950 වර්ෂයෙහි ලංකාවට පැමිණ ථේරවාද බුදු දහම ද ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතිය ද පිළිබඳව හැදෑරූ බව ප්‍රකටය.

ඉන්දීය - ශ්‍රී ලංකා බෞද්ධාගමික සබඳතා ඉතා ඈත අතීතයේ සිට වර්තමානය තෙක් දෙරට අතර සබඳතාවල ස්වරූපය තීරණය කිරීමේ ප්‍රබලම සාධකය බව පැවසීම නිවැරදිය. සෑම වසරක් පාසාම දහස් සංඛ්‍යාත බෞද්ධ සැදැහැවතුන් තම ආගමික ජීවිතයේ අමරණීය සිහිවටනය සේ සලකමින් බුදුරදුන්ගේ ජීවිතය හා සම්බන්ධ සිද්ධස්ථාන කරා ගොස් වන්දනාමාන කිරීම ඉන්දීය - ශ්‍රී ලංකා බෞද්ධ සබඳතාවල ජීවමාන සාධකය වේ. වෙසක් පොහෝ දිනයෙන් සංකේතවත් වන බුදුරජාණන්වහන්සේගේ සම්බුද්ධත්වය සිදු වූ බුද්ධගයාව ඉන්දියාවේ පවත්නා තුරු දෙරට අතර බෞද්ධ සබඳතා පවතිනු ඇත.

**සේවාර්ජිත මහාචාර්ය අසංග තිලකරත්න**
**ප්‍රධාන කර්තෘ : බෞද්ධ විශ්ව කෝෂය**



2012 අගෝස්තු - සැප්තැම්බර් පැවති කපිලවස්තු සර්වඥ ධාතු ප්‍රදර්ශනය

# තුන් ලොව සරසන තෙමඟුල් සැමරුම

මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ



සකල ලෝක වාසී බෞද්ධාගමිකයන් විසින් සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වයට පත්වීම, මහා පරිනිර්වාණය හෙවත් තෙමඟුල් උත්සවය වාර්ෂිකව සමරනුයේ ‘වෙසක් උත්සවය’ හෙවත් ‘වෛශාක්‍ය මංගල්‍යය‘යි. දකුණු බදු දහම හෙවත් ථේරවාදී බුද්ධ ධර්මයෙහි අනුගාමිකයන් වන ශ්‍රී ලාංකිකයින් විසින් සෑම වසරකම මැයි මාසයේ පුර පසළොස්වක දිනයෙහි දී වෙසක් මංගල්‍යය සමරන අතර උතුරු බුදුදහම හෙවත් මහායාන බුද්ධ ධර්මයෙහි අනුගාමිකයන් සේ සැලකෙන චීනය, ජපානය, කොරියාව මෙන්ම තායිලන්තය, තිබ්බතය වැනි රටවල් ද සෑම වසරකම මැයි මාසයේ පළමුවැනි දිනයෙන් එළඹෙන සතියෙහි බුදුන් වහන්සේගේ තෙමඟුල සැමරීම උදෙසා විවිධ උත්සව පවත්වති. හුදෙක් ආගමකට වඩා දර්ශනයක් ලෙස පිළිගැනෙන බුද්ධ ධර්මයෙහි කේන්ද්‍රස්ථානය වන්නේ අප අසල්වාසී ඉන්දියාව හෙවත් භාරත මාතාවයි. මෛත්‍රීය, කරුණාව, මුදිතාව, උපේක්ෂාව මෙන්ම හේතු ඵල ධර්මය මගින් ප්‍රඥාව කරා එළඹීමේ මාර්ගය ද ලෝ වාසී ජනතාවට අවබෝධ කරවන ලද්දේ සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ ම වෙති. අල්පේච්ඡතාව, කරුණාව, දයාව, සමානාත්මතාව මෙන්ම සියලු පදාර්ථයන්හි අනිත්‍ය බව ලොවට හෙළි කරන ලද මහා විද්‍යාඥයා ද වන්නේ සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේය.

භාරත මාතාව විසින් ශ්‍රී ලාංකික අප වෙත දායාද කරන ලද බොහෝ දෑ අතර බුද්ධ ධර්මය අතිශයින්ම වැදගත් වන්නේ වසර 2500 කටත් වඩා පැරණි මුල් බුදු දහමෙහි උරුමකරුවන් හෙවත් මහා කෝෂ්ඨාගාරය ලෙස භාරත මාතාව විසින් ශ්‍රී ලංකාද්වීපය හඳුනාගැනීම නිසාවෙනි. මුල් බුදු දහම හෙවත් ත්‍රිපිටක ධර්මය පළමුවරට ශ්‍රී ලංකාවේ මාතලේ අලුවිහාර සංඝාරාම සංකීර්ණයේ දී වළගම්බා රජුගේ ප්‍රධානත්වයෙන් ග්‍රන්ථාරූඪ කිරීම මේ බවට සාක්ෂි දරයි.



එමෙන්ම බුදුන් ජීවමාන කාලයෙහි දී ම තෙවරක් ශ්‍රී ලංකාද්වීපයට වැඩම කරන ලද බවට මහාවංශයේ ඇති සඳහන මගින් තහවුරු වන්නේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පැවති නිරවුල් අවබෝධය සහ සබඳතාවයි. එකී සඳහන ප්‍රකාරව උන් වහන්සේ මහියංගනය, නාගදීපය, සහ වර්තමානයේ කැලණිය නමින් හඳුන්වනු ලබන කල්‍යාණි ග්‍රාමයට වැඩම කොට එවකට ශ්‍රී ලංකාවේ වාසය කළා යයි සැලකෙන යක්ෂ, නාග සහ දේව ගෝත්‍රික ජනයාට ධර්මය දේශනා කොට ඔවුහු බෞද්ධාගමේ සුපේශල වූ උපාසක උපාසිකාවන් බවට පත් කරන ලද බව එහි ම සඳහන් වීමෙන් පැහැදිලි වන්නේ තම අසල්වැසි රාජ්‍යය මිත්‍යා දෘෂ්ටිකයින්ගෙන් නිදහස් කොට බෞද්ධාගමානුකූල දිවි පෙවෙතක් කරා යොමු කරවීමට බුදුන් ජීවමාන කාලයෙහි සිටම ඇප වී සිට ඇති බව නොවේද? බුදුන් වහන්සේගේ බුද්ධත්වයෙන් නව වැනි මාසයෙහි දී සිදුවූ පළමුවැනි පැමිණීමෙහි දී ම යක්ෂයන් පලවා හැරීමත් ශ්‍රී ලාංකිකයින් බෞද්ධාගමෙහි දායකයින් බවට පත්කිරීමත් මගින් පළමු වතාවට ශ්‍රී ලාංකිකයින් බුදු දහමෙහි පිහිටුවීමට කටයුතු කරන ලද බව පැහැදිලි ය. දැනට ශ්‍රී පාදස්ථානය ට අධිගෘහිත සුමන සමන් දෙවියන් යනු සුමන යක්ෂයා බවත් බුද්ධ ධර්මය ශ්‍රවණය කිරීමෙන් පසු ඔහු බුදු දහමෙහි සුපේෂල උපාසකයෙක් වූ බවත් මහාවංශයේ සඳහන් වේ.

බුද්ධත්වයෙන් පස්වැනි වර්ෂයෙහි දී දෙවන වතාවට ශ්‍රී ලංකාවට වැඩම කරන ලද්දේ චූලෝදර සහ මහෝදර නම් වූ නාග දෙසොහොයුරන් විසින් මැණික් පුටුවක් අරභයා ඇති කරගන්නා ලද ආරවුලක් විසඳම සඳහා බවත්, බුද්ධත්වයෙන් අට වැනි වර්ෂයෙහිදී කැලණියට අධිතෘහිත වූ මනිඅක්ඛිත නා රජු විසින් කැලණියට වැඩම කරන ලෙස කරන ලද ආරාධනයකට අනුව කැලණියට වැඩම කරන ලද බවත් මහා වංශයෙහි ම සඳහන් වේ. ඒ අනුව සැලකීමේදී ශ්‍රී ලංකාද්වීපය සහ භාරත මාතාව අතර තදන්නතර බැඳීමක් ඇති වීම කෙරෙහි බුදු දහමෙන් ලැබුණු පිටුබලය ද අතිමහත් ය.



එමතු දු නොව ශ්‍රී ලංකාවේ බුදු දහම නිත්‍ය වශයෙන් ස්ථාපිත කිරීමේ මාහැඟි මෙහෙවර ධර්මාශෝක රජු විසින් ඔහුගේ රාජ්‍යත්වයෙන් අට වැනි වර්ෂයෙහි දී පවත්වන්නට යෙදුන් තුන්වැනි ධර්ම සංඝායනාවේ ප්‍රතිඵලයක් ලෙසින් පුනර්ජීවනය ලැබූ බව මෙහි දී සඳහන් කළ යුතු ය. මොග්ගලීපුත්ත මහ රහතන් වහන්සේගේ මූලිකත්වයෙන් පැවති තුන්වැනි ධර්ම සංඝායනාවෙහි වඩාත් වැදගත්ම ප්‍රතිඵලය වන්නේ ශ්‍රී ලංකාව ඇතුලු ජනපද දහසයකට බුදු දහම පතුරුවා හැරීම සඳහා ධර්මාශෝක රජු විසින් පියවර ගැනීමයි. ජනපද දහසයක් පුරා පිරිසිදු ථේරවාද බුද්ධ ධර්මය දායාද කිරීමේ දී ධර්මාශෝක රජු විසින් තම මිත්‍ර රාජ්‍යය වූ ශ්‍රී ලංකාද්වීපය වෙත දූත මෙහෙවරෙහි යොදවන ලද්දේ තම එකම පුත්‍රයා වූ මහින්ද මහ රහතන් වහන්සේ ය. ක්‍රි. පූර්වයෙන් තුන්වන සියවසේ අග භාගයේ දී සිදු වූ මෙකී ධර්ම චාරිකාවෙහි දී ධර්මාශෝක රජු විසින් ශ්‍රී ලංකාවට දායාද කරන ලද්දේ බුද්ධ ධර්මය පමණක්ම නොවේ. එවකට ශ්‍රී ලංකාවෙහි රාජ්‍ය පාලනය කළ තිස්ස නම් රජු හට ‘දෙවන ප්‍රිය ප්‍රියදර්ශී‘ නම් වූ රාජාභිෂේකය ද පිරිනමන ලද්දේ මේ අවස්ථාවිදී ය. ඒ ධර්මාශෝක රජු විසින් තම හිත මිතුරු රාජ්‍යයේ පාලකයා තමන් හා සමාන තත්ත්වයෙන් ම සලකනු වස් තම පුත්‍රයා වූ මිහිඳු මහ රහතන් වහන්සේ සමග එවන ලද රාජකීය අභිශේකයයි. ‘දෙවන ප්‍රිය ප්‍රිය දර්ශී‘ යනු භාරතීය රාජ්‍ය පාලකයකු විසින් දැරිය හැකි උසස්ම අභිශේකයයි. එවැනි අභිශේකයනට උරුමකම් කියූ එකම විදේශ රාජ්‍ය පාලකයා වූයේ ශ්‍රී ලංකාද්වීපයෙහි එවකට පාලකයා වූ දේවානම් පිය තිස්ස නමින් අප අද හඳුන්වන තිස්ස රජතුමා ය. අනුරාධපුරය කේන්ද්‍රගත කරගනිමින් තම රාජ්‍ය පාලන කටයුතු මෙහෙයවන ලද තිස්ස රජු හට මිහිඳු හිමියන්ගේ ලංකාගමනය මහත් අස්වැසිල්ලක් මෙන්ම ප්‍රීත උද්දාමයට කරුණක් වූ බව ද පැහැදිලිය. කෙසේ වුව ද, තමන් විසින් දරණ ලද රාජාභිශේකය හා සමාන තත්ත්වයක් තම අසල්වැසි සොයුරු රාජ්‍යයේ මිත්‍ර පාලක තිස්ස රජු වෙත පිරිනැමීම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පැවති විදේශ සබඳතාව මැනවින් තහවුරු කරන ලද අවස්ථාවක් ලෙස වර්තමානයෙහි ද සිහිපත් කළ යුතුව ඇත.



මිහිඳු හිමි විසින් ශ්‍රී ලංකාවට බුදු දහම හඳුන්වා දීමේ දී ඒ හා බැඳුනු සංස්කෘතියක් ද අප වෙත දායාද කරන ලද බව අප විසින් අමතක නොකළ යුතුය. එය ශ්‍රී ලාංකේය කලාවේ සහ සංස්කෘතියෙහි පර්වර්තනීය අවධියක් බව සැලකෙන්නේ එහෙයිනි. ප්‍රාග් බෞද්ධ යුගයෙහි සිට පැවත එන ශ්‍රී ලාංකේය කලාව, සංස්කෘතිය, දේශපාලනය මෙන්ම අර්ථ ක්‍රමය ද ව්‍යුහාත්මකව සහ දිශානුගත ක්‍රමවේදයක් ඔස්සේ ක්‍රියාත්මක වන්නේ බෞද්ධාගම හා අතිනත ගැනීමේ ප්‍රතිපලයක් වශයෙන් බව පැහැදිලි ය. උන් වහන්සේ විසින් ශ්‍රී ලාංකේය ජනතාවට ධර්මය දේශනා කළා ම පමණක් ම නොවේ. බෞද්ධාගම මත පදනම් වූ භික්ෂු ශාසනය මෙන්ම උපාසක උපාසිකා සමාජයක් ද, ඒ මත පදනම් වූ අද්විතීය කලා සම්ප්‍රදායක් ද බිහිවන්නේ මිහිඳු හිමිගේ ආගමනයත් සමග ය. රාවණ යුගයේ සිට පැවත එතැයි සැලකෙන විශාල මන්දිර, ස්තූප, ප්‍රාසාද, ප්‍රාකර, ආරාම ආදී බොහෝ ගෘහ නිර්මාණ අංග මෙන්ම අනෙකුත් සැරසිලි අංග ද බෞද්ධාගමික මුහුණුවරකින් යුක්තව ගොඩනැගෙනුයේ බුදුදහම ලංකාවෙහි ස්ථාපිත වීමත් සමග ය. මීට හොඳම උදාහරණය වන්නේ වර්තමාන අනුරාධපුරයේ මහා විහාර සංකීර්ණය නමින් හැඳින්වෙන සංඝාරාම සංකීර්ණයයි. මිහිඳු මහ රහතන් වහන්සේ විසින් දේවානම් පියතිස්ස රජුගේ රාජකීය නගුල උපයෝගී කරගනිමින් මනා සැලසුමකින් යුක්තව ඉදිකරන ලද මෙම සංකීර්ණය ශ්‍රී ලංකාවේ ප්‍රථම ඓන්ද්‍රීය විහාරාරාම (Organic Monastery) සංකීර්ණය ලෙස ද හඳුනා ගැනේ. මෙහි විශේෂත්වය වන්නේ බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද පාරිසරික හිතකාමී වාසස්ථානයක් ලෙස මහා විහාර සංකීර්ණය හඳුනාගත හැකි වීමයි. ‘ආරාම රෝපා-වන රෝපා‘ යනුවෙන් බුද්ධ දේශනාවෙහි ඇති සඳහන මෙහිදී අනුගමනය කරන ලද බව මොනවට පැහැදිලි වේ.

වසර 2500ක් පැරණි බුද්ධ ධර්මය සහ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පැවති තදනන්තර බැඳීම සිහිපත් කරවන අනෙක් ප්‍රධාන සිදුවීම වන්නේ භික්ෂුනී ශාසනය මෙරට ස්ථාපිත කිරීම සඳහා ලබා දෙන ලද දායකත්වයයි.




භික්ෂුනී ශාසනය ශ්‍රී ලංකාද්වීපයෙහි ස්ථාපිත කිරීම සඳහා ධර්මාශෝක රජු විසින් ශ්‍රී ලංකාවට එවන ලද්දේ ඔහුගේ ම දියණිය වූ සංඝමිත්තා භික්ෂුනියයි. ශ්‍රී ලංකාවෙහි භික්ෂුනී ශාසනය සම්බන්ධයෙන් වැදගත් වන මෙම පැමිණීම දේවානම්පියතිස්ස රජුගේ බලවත් ඉල්ලීම මත ධර්මාශෝක රජු විසින් ශ්‍රී ලංකාද්වීපය වෙත එවන ලද දෙවැනි ධර්ම ත්‍යාගය ලෙස හැඳින්වීම නිවැරදිය. දේවානම්පියතිස්ස රජුගේ නෑනනුවන් වූ අනුලා දේවිය ප්‍රථම වරට මිහිඳු හිමියන්ගේ ධර්මය ශ්‍රවනය කොට බුද්ධ ධර්මයේ උපාසිකාවක් ලෙස සරණ ගිය අතර භික්ෂුනි ශාසනයට ඇතුලුවීම සඳහා ඇයගේ තිබූ නොසැලෙන අධිෂ්ඨානය මෙකී පැමිණීමට හේතු වූ බව මහා වංශය සඳහන් කරයි. ඒ අනුව සැලකීමෙහිදී භික්ෂු ශාසනය මෙන්ම භික්ෂුනී ශාසනය ඇති කිරීමෙහි ලා අසල්වැසි භාරත මාතාව ශ්‍රී ලංකාව හා අත්වැල් බැඳගත් බව පැහැදැලි ය. ක්‍රි. පූර්වයෙන් වර්ෂ 288 හි දී උඳුවප් මස පුර පසලොස්වක දින ශ්‍රී ලංකාවෙහි දඹකොළ පටුන හෙවත් වර්තමානයෙහි යාපනය නමින් හැඳින්වෙන උතුරු දිග ජැටියෙන් ලක්දිවට ගොඩබට සංඝමිත්තා තෙරණිය ශ්‍රී ලංකාවට වැඩම කරන ලද්දේ ඉන්දියාවේ බුද්ධගයාවේ පිහිටි බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වූ ශ්‍රී මහා බෝධියෙහි දකුණු අතු ධාතුවෙන් හටගත් බෝධි අංකුරයක් සහිත පාත්‍රා ධාතුව සහ තවත් බීංජාකුර තිස් දෙකක් ද සමග ය. දේවානම් පිය තිස්ස රජු විසින් ඉතා හරසරින් යුතුව පිළිගන්නා ලද මෙම ශ්‍රී මහා බෝධි වෘක්ෂය මිහිඳු මහ රහතන් වහන්සේගේ උපදෙස් සහ අනුශාසනා පරිදි මහා විහාර සංකීර්ණයෙහි රෝපණය කරන ලදි. මිනිස් දෑතින් රෝපණය කරන ලද ලොව දැනට ඉතිරිව ඇති පැරණිතම ශාකය වන්නේ මෙම ජය ශ්‍රී මහා බෝධියයි. එමෙන් ම ලෝක වාසී බෞද්ධ ජනතාව විසින් ඉමහත් බැතියෙන් පුද ලබන බුදුන් වහන්සේගේ පාරිභෝගික ධාතු වලින් එකක් වන්නේ ද ජය ශ්‍රී මහා බෝධිය යි. මහනුවර ශ්‍රී දළදා මාළිගාවෙහි තැන්පත් කොට ඇති බුදුන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ ද භාරත මාතාව විසින් ශ්‍රී ලංකාවට තිළින කරන ලද තවත් වැදගත් දායාදයකි. ඊට අමතරව බෞද්ධාගම මත පදනම් වූ ස්වාධින කලා සම්ප්‍රදායක් සහ සාහිත්‍යයක් ද ශ්‍රී ලංකාද්වීපය සතුව ඇති බව අප විසින් අමතක නොකළ යුතු ය. ස්තූප ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රබල තාක්ෂනික ඥානය මෙන්ම බුද්ධ ප්‍රතිමාව, සඳකඩ පහණ, මුරගල, කොරවක්ගළ, වාහල්කඩ ආදී ස්වාධීන කලාංග ද මේ අතර වැදගත් ය.



මේ අනුව සැලකීමේදී වසර 2500 ක බෞද්ධාගමික ඉතිහාසය තුල භාරත මාතාව සහ ශ්‍රී ලංකාද්වීපය අතර මනා වූ අවබෝධයක් සහ සබඳතාවක් ඇති වී තිබෙන බව අපට පැහැදිලි වන්නේ මෙකී ඓතිහාසික සිදුවීම් වටා ගොඩ නැගීඇති ප්‍රබල සංස්කෘතියක උරුමකරුවන් බවට පත්වීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබීමයි. දකුණු ආසියානු කලාපය තුල අනෙකුත් දේශයන් අතර ඇති සමීප සබඳතාව සහ සහයෝගීතාව ඉක්මවා ගිය සොයුරු බැඳීමක් ඒ තුල අන්තර්ගත ව ඇති බව වඩාත් ඒ අනුව තහවුරු වෙයි. ආගම කේන්ද්‍රීය වූ අර්ථ ක්‍රමයක්, දේශපාලනික සහ සමාජ සංස්කෘතියක් ඒ තුල නිරන්තරයෙන්ම විද්‍යාමාන ය. මෙහිදී අප විසින් වඩාත් හොඳින් අවබෝධ කරගත යුතු කාරණය වන්නේ ඉන්දීයාවෙන් ලැබුණු පෝෂනය උපයෝගී කරගනිමින් ස්වාධීන රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවට නැගී සිටීම සඳහා භාරත මාතාව විසින් අප වෙත දිගු කරන ලද සහෝදරත්වයේ මාවතයි.

ඊට ප්‍රධානතම හේතුව වන්නේ භාරත මාතාව හා උරෙන් උර සිටිමින් කලාපීය සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාද්වීපයට ඇති හැකියාව භාරත මාතාව විසින් ඉඳුරා අවබෝධ කරගැනීමයි. සංස්කෘතිකමය වශයෙන් ඇතිවන සහ සබඳතා අන් කවර බැඳීමකටත් වඩා ශක්තිමත් බව අප ඉතා හොඳින් දන්නා දෙයකි. එය අදටත් වඩා හොඳින් දැනට වසර 2500කට පෙර දෙරටෙහි පාලකයන් විසින් ඉතා හොඳින් අවබෝධ කොටගෙන තිබූ බව ඉහත සාධක වලින් මැනවින් පැහැදිලි වෙයි. එබැවින්, එකී මානව, සංස්කෘතික සහ සමාජ සබඳතා තව දුරටත් තහවුරු කරගැනීමට එළඹෙන වෙසක් උත්සව සමයෙහි දී අප විසින් ද අධිෂ්ඨාන කර ගත යුතු ය. සියලු ලෝක වාසී ජනතාවට නිදුක් නිරෝගී සුභ වෙසක් මංගල්‍යයක් වේවා!

**මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ**
අධ්‍යක්ෂිකා,
සාර්ක් කලාපීය සංස්කෘතික මධ්‍යස්ථානය,
224, බෞද්ධාලෝක මාවත, කොළඹ 7



## සාරානාත් හි ධමෙක් ස්ථූපය - බුදුන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූ ස්ථානය

ධමෙක් ස්ථූපය - උත්තර ප්‍රදේශ් හි සාරානාත් හි පිහිටා ඇති මෙම ස්ථූපය බුදුන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව වන දම්සත් පැවතුම් සූත්‍රය දේශනා කළ ස්ථානයේ පිහිටා ඇත. මුල් ස්ථූපය ක්‍රි. පූ. 3 වන සියවසේදී ඉදි කර ඇතැයි විශ්වාස කෙරේ. වර්තමානයේ දක්නට ලැබෙන ස්ථූපය මුල් ස්ථූපයට වඩා බෙහෙවින් විශාල වන අතර ක්‍රි.ව. පළමු සියවසේ මැද භාගයේ දී පමණ ඉදි කර ඇත. මෙය ද බෞද්ධයන්ගේ අති පූජනීය ස්ථාන හතරෙන් එකකි.

# බුදු දහමෙන් පෝෂිත ඉන්දු ශ්‍රී ලංකා සබඳතාව



## ආචාර්ය කිරින්දේ අස්සජි ස්ථවිර

ඉන්දියන් සාගරය මධ්‍යයේ කුඩා මුතු ඇටයක් මෙන් පිහිටා ඇති ශ්‍රී ලංකාව සහ ලෝක සිතියමේ ශ්‍රී ලංකාවට මදක් ඉහළට වන්නට පිහිටා ඇති ඉන්දියාව අතර පවතින්නේ සමීප සම්බන්ධතාවයකි. භූ ගෝලීය වශයෙන් ගත්කළ ශ්‍රී ලංකාවට ඉතාමත් ආසන්නයේ පිහිටි රට වන්නේ ඉන්දියාවයි. එපමණක් නොව සංස්කෘතිකමය වශයෙන්ද ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර බොහෝ සමානතා දක්නට ලැබේ. මේ සමානතාවලට බෙහෙවින්ම හේතුව වන්නට ඇත්තේ දෙරට පිහිටා ඇති සුවිශේෂී භූගෝලීය පිහිටීමයි. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ඇති සබඳතාවය ක්‍රිස්තු පූර්ව හයවන සියවසටත් ශත වර්ෂ ගණනාවක් ඈත අතීතයේ සිට පැවත එන්නකි. ඒ පිළිබඳව සඳහන්වන හොඳම උදාහරණය වන්නේ වාල්මිකී විසින් රචිත රාමායනයයි. දෙරට පවතින මේ අනොන්‍ය සබඳතාවය නිසාම ශ්‍රී ලාංකේය කලාව, සාහිත්‍යය, වැඳුම් පිදුම් පිළිවෙත්, අධ්‍යාපනය, කෘෂිකර්මාන්තය, ආහාර පාන ආදී වූ සෑම අංගයකම ඉන්දීය සංස්කෘතික අංග ලක්ෂණයන් දක්නට ලැබේ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අනෝන්‍ය වශයෙන් බැඳෙන ප්‍රධානම සාධකය වන්නේ බුදු දහමයි. මුලු ලොවම මෝහයේ ඝනාන්ධකාරයෙන් වැසී පැවති යුගයක ප්‍රඥාවේ ප්‍රදීප දල්වාලමින් පහළ වූ බුදුහිමියන් ඉපදුනේත්, බුද්ධත්වයට පත්වූයේත්, පිරිණිවන්පා වදාලේත් ඉන්දියාවේදී උවත් උන්වහන්සේ විසින් දේශා කරන ලද ශ්‍රී සද්ධර්ම නොනැසී සුරැකිව පවතින්නේ ශ්‍රී ලංකාව තුළය.

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පැවති ඓතිහාසික සබඳතා පිළිබඳව අධ්‍යයනයේදී මූලික වශයෙන් කරුණු ලබාගත හැකි මූලාශ්‍රයන් ද්විත්වය වන්නේ ලිඛිත මූලාශ්‍ර සහ අලිඛිත මූලාශ්‍රයන් ය. ඒ අතරින් ශ්‍රී ලංකාවේ පැරණිතම ලිඛිත ඓතිහාසික මූලාශ්‍රය ලෙසින් හඳුන්වනු ලබන මහාවංශයෙහි මේ සම්බන්ධයෙන් වූ බොහෝ කරුණු කාරණා සවිස්තරාත්මකව දක්වා තිබේ. ශ්‍රී ලංකාවට බුදු දහමේ පවතින සම්බන්ධත්වය පිළිබඳව විමසීමේදී මුලින්ම මතකයට නැගෙන සිදුවීම වන්නේ බුදුරදුන් බුද්ධත්වයට පත්ව සත්සති ගෙවා අවසන්වද්දී උන්වහන්සේට විලඳ මී පිඩු පූජා කළ තපස්සු හල්ලුක වෙළඳ දෙබෑයන් හට බුදු

රදුන් විසින් පිරිනැමු කේශ ධාතු අට මිට නිධන් කර තිරියායේ සෑයක් නිර්මාණය කිරීමයි. එමෙන්ම ඒ මගින් පෙනී යන තවත් කරුණක් වන්නේ ඒ කාලයෙත් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර වෙළඳාම් කටයුතු සිදු වූ බවයි.

ඉන් අනතුරුව බුදු රදුන් තෙවරක් ශ්‍රී ලංකාවට වැඩම කළ බවට දීපවංශය, මහාවංශය සහ සමන්තපාසාදිකාව වැනි මූලාශ්‍ර ග්‍රන්ථවල විස්තරාත්මකව සඳහන් කර තිබේ. ඒ අනුව බුද්ධත්වයෙන් නව වන මාසයේදී මහියංගනයට වැඩම කළ උන්වහන්සේ, බුද්ධත්වයෙන් පස්වන වර්ෂයේදී නාගදීපයටත්, බුද්ධත්වයෙන් අටවන වර්ෂයේදී කැළණියටත් වැඩම කර සමනල කඳු මුදුනේ තම සිරිපතුල එහි පිහිට වූ බවත් සඳහන් වෙයි.

ඉන් අනතුරුව ඉන්දියාවේ සිට මෙරටට දූත පිරිසක් පැමිණෙන්නේ බුද්ධ පරිණිර්වාන දිනයේදී ය. ඒ වංශකතාවන්ට අනුව ලංකා රාජාවලියෙහි ආරම්භක පාලකයා ලෙසින් හැඳින්වෙන විජය කුමාරයා ඇතුළු පිරිසයි. ඉන් අනතුරුව වරින් වර විවිධ දූත කණ්ඩායම් විවිධාකාරයේ දේශපාලනික හේතු මත ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණ තිබේ. තවද ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පැවති වෙළඳ සබඳතා හේතුවෙන්ද බොහෝ වෙළඳ පිරිස් නිරන්තරයෙන් දෙරට අතර වෙළඳ කටයුතු සිදුකළ බවට මහාවංශය ඇතුළු ග්‍රන්ථ සාහිත්‍යත්, ගොඩවාය සෙල්ලිපිය වැනි ශිලා ලේඛනත් සාක්ෂි දරයි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ සුවිශාලතම පුනරුදය ඇතිවන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 ක් ගෙවුණු පසුවය. ඒ ඉන්දියාව අශෝක අධිරාජ්‍යයා විසින් පාලනය කරන සමය විය. අශෝක අධිරාජ්‍යයාගේ 18 වන රාජ වර්ෂයේදී එතුමාගේ අනුග්‍රහයෙන් මොග්ගලිපුත්තතිස්ස මහරහතන්වහන්සේ විසින් පැවැත් වූ තෙවන ධර්ම සංඝායනාවෙන් පසු ශ්‍රී ලංකාව ඇතුළු රටවල් නවයකට ධර්ම දූතයන් පිටත් කර හරිනු ලැබීය. ඒ වකවානුව වනවිට ශ්‍රී ලංකාවේ පාලකයාව සිටියේ දේවානම්පියතිස්ස රජුය. එකල ඉන්දු ශ්‍රී ලංකා සබඳතා කෙතරම් ශක්තිමත්ව පැවතියේද යත් දෙවනපෑතිස් රජතුමා සහ අශෝක අධිරාජ්‍යයා සිය පුතණුවන් වූ මිහිඳු මාහිමියන් ප්‍රමුඛ හත් දෙනෙකුගෙන් සෑදුම්ලත් දූත පිරිසක් ශ්‍රී ලංකාවට වැඩම කරවීය. ඒත් සමගින් බෞද්ධ අභිෂේක ක්‍රමය ද මෙරටට දායාද විය.

ඒ ලෙසින් මිහිඳු හිමියන් මෙරටට බුදු දහම තිළිණ කිරීමේ මහඟු කර්තව්‍යයට උරදෙනු ලැබීය.

මිහිඳු මාහිමියන් ශ්‍රී ලංකාවට බුදු දහම දායාද කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ භික්ෂුණී සාසනය ඇරඹීම සඳහා ශ්‍රී ලාංකේය කාන්තා පරපුරෙන් පැන නැගී ඉල්ලීම හේතුකොට ගෙන අශෝක අධිරාජයාගේ දියණිය වූ සංඝමිත්තා රහත් මෙහෙණිය ප්‍රමුඛ පිරිසක් ශ්‍රී ලංකාවට වැඩම කරවනු ලැබීය. එතුමිය සමගින් බුදුන් වහන්සේට බුදු වීමටම සෙවණ දුන් ඉන්දියාවේ ජය ශ්‍රී මහා බෝධියෙහි දක්ෂිණ අංකුරය ද ශ්‍රී ලංකාවට වඩමවනු ලැබීය. එපමණක් නොව ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි පළමු හැරවුම් ලක්ෂය වන්නේ ද එම සිදුවීමයි. එයට හේතුව වන්නේ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමග දහඅට කුලයක පිරිසක්ද පැමිණීමයි. ඒ අනුව මෙරටට අලුත් කර්මාන්ත ක්‍රම දහඅටක් තිළිණ වූ අතර ඒවාත් සමග විවිධාකාරයේ කලා ශිල්ප, සංස්කෘතිකාංග, වැඳුම් පිදුම් පිළිවෙත්, ආහාර පාන රටා, කෘෂිකර්මාන්තය ඇතුළු බොහෝමයක් ක්ෂේත්‍රයන්වල පිබිදීමක් ඇති විය.

මෙලෙසින් පැවති ඉන්දු ශ්‍රී ලංකා ආගමික සබඳතා පසු කාලීනව බිහිවූ රජවරුන් විසින් තව තවත් තර කරවනු ලැබීය. මෙලෙසින් මෙරටට බුදු දහම හා සම්බන්ධව ඉන්දියාවෙන් දායාද වූ ප්‍රධාන දායාදයක් වන්නේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීමයි. ඉන්දියාවේ උදේනි නුවර ගුහාශිව රජුගේ පුතනුවන් වන දන්ත කුමරු සහ දියණිය වන හේමමාලා කුමරිය විසින් දන්ත ධාතූන්වහන්ගේ ලංකාවට වඩම්මවනු ලැබුවේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ කාලයේදීය.

මෙලෙස බුදු දහම සමග තර වූ දෙරට සබඳතා දිගින් දිගටම ශතවර්ෂ ගණනාවක් පුරාවටම පැවත ආ අතර මෑත කාලීන ඉතිහාසයෙහි සඳහන් වන වඩාත් කතාබහට ලක් වූ කාරණාව වන්නේ මීට වසර අනූවකට පමණ පෙර දී අනගාරික ධර්මපාලතුමන් විසින් බුද්ධගයාව බෞද්ධයන් සතු කරගැනීම සඳහා ක්‍රියා කළ ආකාරයයි.



එයින් අනතුරුව අද දක්වාම බුද්ධගයාව රැකබලා ගන්නේ මහා බෝධි සමාගමේ ශ්‍රී ලාංකේය භික්ෂූන්වහන්සේලා විසිනි. එපමණක් නොව දිනපතා ශ්‍රී ලාංකේය බැතිමතුන් සිය ගණනින් දඹදිව පිහිටි බුදුන් වහන්සේගේ පාද ස්පර්ෂය ලද පූජා භූමි වන්දනාමාන කිරීම සඳහා ඉන්දියාවට ගමන් කරයි. මේ ආකාරයට බුදු දහමින් පෝෂණය වූ හරි අපූරු සබැඳියාවක් ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ශත වර්ෂ ගණනාවක් පුරාවට පවතී.

**ආචාර්ය කිරින්දේ අස්සජි ස්ථවිර**

**විහාරාධිකාරි**
**හුණුපිටිය ගංගාරාම විහාරස්ථානය**



## පද්මපානි බෝධිසත්ත්ව රූපය - අජන්තා හි පළමු ගුහාව

අජන්තා හි පළමු ලෙනෙහි බෝධිසත්ත්ව පද්මපානි සිතුවම, - මහාරාෂ්ට්‍ර හි ඖරංගබාද් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අජන්තා ලෙන් හි ක්‍රි.පූ. 2 වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 480 දක්වා පමණ ගලෙන් නිර්මිත බෞද්ධ මූර්ති 30ක් පමණ දක්නට ලැබේ. මෙම ලෙන්හි ඇති සිතුවම් සහ ගලෙන් නෙළූ මූර්ති පෞරාණික ඉන්දියානු කලාවේ අද දක්වාම පවතින විශිෂ්ට නිර්මාණ වේ. පළමු ලෙනෙහි දක්නට ලැබෙන බෝධිසත්ත්ව පද්මපානි සිතුවම වැනි අජන්තා සිතුවම් බෞද්ධ කලාවේ ඉතා දක්ෂ අයුරින් හැඟීම් නිරූපිත අග්‍රගණ්‍ය නිර්මාණ ලෙස ලොව පුරා පිළිගැනේ. මෙය යුනෙස්කෝ ලෝක උරුමයක් ද වේ.



2015 මාර්තු මාසයේදී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා
ජය ශ්‍රී මහා බෝධිය වන්දනා කරමින්...

# බුදු දහමින් පෝෂිත ඉන්දු - ලංකා සබඳතා



මහාචාර්ය සඳගෝමි කෝපරහේවා

වෙසක් පුන් පොහෝ දිනය ලොව පුරා වෙසෙන බෞද්ධ ජනයාගේ වඩාත් පූජනීය දිනය වෙයි. බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වය හා මහා පරිනිර්වාණය සිහිපත් කරන එම දිනය ලක්දිව බෞද්ධ ජනතාව විසින් මහත් ගෞරවයෙන් සමරනු ලබයි. එමෙන්ම වෙසක් දිනය යනු ඉන්දියාව හා ලංකාව යන දෙරට ම බුදු දහමේ උරුමය සැමරීමේ අවස්ථාවකි. බුදු දහම සියවස් ගණනාවක් මුළුල්ලේ පරම්පරා ගණනාවක් පුරා ඉන්දු - ලංකා සමාජයන් සම්බන්ධ කරන ඓතිහාසික උරුමයක් ලෙස ද හඳුන්වා දිය හැකි ය.

බුදු දහමින් පෝෂිත ඉන්දු - ලංකා සම්බන්ධතාව වසර 2500 කට වඩා පැරණි ය. බුදුන් වහන්සේ ජීවමානව වැඩ සිටි කාලයේ පටන් ම දඹදිව හා ලක්දිව අතර පැවති සබඳතා පිළිබඳව සඳහන් වේ. බුදුන් වහන්සේගේ බුද්ධත්වයෙන් සත්වන සතියේ දී තපස්සු, භල්ලුක යන වෙළෙඳ දෙබෑයන්ට ලබා දුන් කේශ ධාතු නිදන් කොට ලක්දිව නැගෙනහිර වෙරළ ආසන්නයේ තිරියායි නම් ස්ථානයේ චෛත්‍යයක් කරවූ බව සඳහන් වේ. පසු කලෙක එම චෛත්‍යය ප්‍රකට වූයේ ගිරිහඬු සෑය නමිනි. ඒ අනුව තපස්සු, භල්ලුක යන වෙළෙඳ දෙබෑයන් ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි පළමු බෞද්ධ උපාසකයන් බව හෙළි වේ.

ශ්‍රී ලංකාවේ පුරාණ බෞද්ධ මූලාශ්‍රවලින් කියැවෙන්නේ බුදුන් වහන්සේ අවස්ථා තුනක දී මෙරටට වැඩම කළ බව යි. මහියංගණය, නාගදීපය හා කැලණිය යන ස්ථානවලට වැඩම කළ අවස්ථාවල දී බුදුන් වහන්සේගේ පාද ස්පර්ශයෙන් පූජනියත්වයට පත් සොළොස්මස්ථාන පිළිබඳ විස්තර වංශකථාවල මෙන්ම සාහිත්‍ය මූලාශ්‍රයවල දැක්වේ. මෙම පූජනීය ස්ථාන දහසය ශ්‍රී ලංකාවේ වැදගත් ම ආගමික ස්ථාන අතර වන අතර ඒවා රට පුරා පිහිටා ඇත.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ද ඉන්දියාව හා ලංකාව අතර පවත්නා බුද්ධිමය, සංස්කෘතික, ආගමික හා භාෂාමය සම්බන්ධතා පෝෂණය වී ඇත්තේ බුදු දහමිනි. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ මිත්‍රත්වය වසර 2500 කට අධික කාලයක් මුළුල්ලේ බුද්ධාගම මගින් ශක්තිමත් වී ඇත. සිංහල වංශ කථා සම්ප්‍රදායට අනුව, බුදු දහම ප්‍රථම වරට ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුවේ මෞර්ය අධිරාජ්‍යයා වූ අශෝකගේ පාලන සමයේ දී (ක්‍රි.පූ. 268 -232) නැගෙනහිර ඉන්දියාවෙන් ලංකාව වෙත එවන ලද දූත

කණ්ඩායමක් මගිනි. ශ්‍රී ලංකාවට පැමිණි මෙහෙයුමේ නායකයා වූයේ අශෝකගේ පුත්‍රයා වූ මහින්ද හිමි ය. මහින්ද හිමි ප්‍රමුඛ පිරිස අනුරාධපුරයේ පිහිටි මිහින්තලාවට පැමිණි අවස්ථාවේ දී ඔවුන්ට ලක්දිව රජ කළ දේවානම් පිය තිස්ස ( 250 – 210 ) රජතුමා මුණගැසීමට අවස්ථාව ලැබුණි. එම හමුවීම ලක්දිවට බුදු දහම හඳුන්වා දුන් අවස්ථාව ලෙස සලකනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුරයේ මහවිහාර ආරාමය ස්ථාපිත කරන ලද අතර එය ලක්දිව බුදු දහමේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත්විය.

අශෝක රජතුමා ලක්වැසියන් කෙරේ විශේෂ සැලකිල්ලක් දැක්විය. සිය පුතණුවන් වූ මිහිඳු මා හිමියන් මේ දිවයිනේ බුදු සසුන පිහිටුවීමෙන් පසුව සිය දියණියන් වූ සංඝමිත්තා තෙරණියන් ද ලක්දිවට පිටත් කොට එවන ලද්දේ විශේෂ ආගමික පඬුරක් වූ ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව සමග ය. අනුරාධපුරයේ ‘ ශ්‍රී මහා බෝධීන් වහන්සේ’ ලක්වැසි බෞද්ධ ජනයාගේ මහාර්ඝ පූජනීය වෘක්ෂයකි. බෞද්ධයන් විසින් මහාබෝධි නමින් හඳුන්වනු ලබන මේ වෘක්ෂය මෙරට ශාසන වංශ කථාවේ පමණක් නොව ඉන්දු ලංකා සබඳතාවල වැදගත් තැනක් හිමි කර ගනියි. සිංහල වංශ කථාවල සඳහන් වන පරිදි මහා බෝධිය ආරක්ෂා කිරීම සඳහා බෝධි වෘක්ෂය සමග එක්තරා කුල පිරිසක් දඹදිව සිට ලක්දිවට පැමිණ ඇත.

මහනුවර දළදා මන්දිරයේ තැන්පත් කොට දළදා වහන්සේ ද සිංහල බෞද්ධ ජනතාව සතු පරම පූජනීය වස්තුවකි. පුරාවෘත්තයන්ට අනුව බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු දන්ත ධාතූන් වහන්සේ ඉන්දියාවේ කාලිංගයේ සංරක්ෂණය කොට එහි ගුහසීව රජතුමා භාරයේ වැඩ සිටි සේක. පසුව ගුහාසිව රජුගේ දියණියන් වූ හේමාමාලි කුමරිය සහ ඇගේ සැමියා වන දන්ත කුමරු දඹදිව කලිඟු රට සිට දළදා වහන්සේ ලක්දිවට වැඩමවා ගෙන ආහ. එකල ලක් රජය කළ කිර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමා දළදා වහන්සේ පිළිගෙන අනුරාධපුරයේ අභයගිරි විහාරයේ තැන්පත් කොට පුද සත්කාර කෙළේය. එතැන් පටන් මහනුවර රාජධානි සමය දක්වා ම රජ දරුවෝ ද ලක්වැසි ජනතාව ද දළදා වහන්සේ රාජකීය පූජනීය වස්තුවක් ලෙස සලකා පුද පූජා පවත්මින් රැක ගත්හ.

ක්‍රි.පූ. තුන්වන සියවසේ දී බුද්ධාගම හඳුන්වා දුන් දා සිට ලක්දිව ථෙරවාද බෞද්ධ ධර්මයේ කේන්ද්‍රස්ථානයක් වී ඇත. පස් වන සියවසේ දී පමණ ඉන්දියානු සම්භවයක් ඇති බුද්ධඝෝෂ තෙරණුවෝ ලක්දිවට වැඩම කොට මහා විහාරයේ වැඩ වසමින් බුද්ධ ධර්මය සඳහා හෙළ බසින් පැවති අටුවා පාලි බසට පරිවර්තනය කොට ථෙරවාද බුද්ධ ධර්මය ප්‍රචාරය සඳහා කටයුතු කළහ.

ශ්‍රී ලංකාවේ කලා ශිල්ප හා සාහිත්‍යය ගොඩනැගුණේ බුදු සමය මුල් කර ගෙන ය. පැරණිතම සිංහල සෙල් ලිපි ලියා ඇත්තේ බ්‍රාහ්මී අක්ෂරවලින් වන අතර ක්‍රි. පූ. තුන්වන සියවසේ දී පමණ එම අක්ෂර මාලාව හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ ද මිහිඳු මා හිමියන්ට ය. නූතන ඉන්දු ආර්ය භාෂාවලට සම්බන්ධයක් ඇති සිංහල භාෂාව මුල් කර ගෙන සිංහල බෞද්ධ සාහිත්‍යයක් ද ඇති විය. එමෙන්ම ලක්දිව ඉදි කෙරුණු ස්තූප, විහාරාම, බුදු පිළිම, පිළිම ගෙවල් හා වෙනත් කැටයම් කෙරේ ඉන්දියානු කලා සම්ප්‍රදායන් මහත් බලපෑමක් ඇති කෙළේය. පසුව ලාංකික කලා ශිල්පීහු ද ලක්දිවට ආවේණික වූ ස්වාධීන කලා කෘති බිහි කිරීමට ද සමත් වූහ.

පුරාණ ලංකාවේ විවිධ යුගවල දී ඉන්දියානු සම්භවයක් ඇති නිස්සංකමල්ල වැනි කාලිංග වංශික රජවරුන්ගෙන් හා කීර්ති ශ්‍රී රාජසිංහ වැනි නායක්කර් වංශික රජවරුන්ගෙන් බුදු සසුනේ දියුණුවට සැලසුණු මෙහෙය ඉතා ප්‍රකට ය. එම රජවරු බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස සලකා පෝෂණය කළහ.

ශත වර්ෂ ගණනාවකට පසුව ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර බෞද්ධ ආගමික සම්බන්ධතා යළි ඇති වූයේ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ දී ය. ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයකු වූ **අනගාරික ධර්මපාලතුමා** (1864 – 1933) විසින් ආරම්භ කරන ලද කටයුතු නිසා ශතවර්ෂ ගණනාවක පටන් බිඳ වැටී තිබූ ඉන්දියාවේ බුදු දහමේ යළිත් පුනරුදයක් ඇති විය. අභාවයට යමින් පැවති ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන නගා සිටුවීම සඳහා අප්‍රතිහත ධෛර්යයෙන් යුතු ව කටයුතු කළ ධර්මපාලතුමා ඉන්දියානු මහාබෝධි සමාගම පිහිටුවමින් නූතන යුගයේ බෞද්ධ පුනරුදය උදෙසා කටයුතු කළහ. බුද්ධගයාව, කුසිනාරා වැනි ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට සිංහල බෞද්ධ බැතිමතුන්ට අවස්ථාව ලැබුණේ ධර්මපාලතුමා ප්‍රමුඛ මහාබෝධි සමාගමේ කටයුතු නිසා ය. එමෙන්ම ධර්මපාලතුමා සහ රබින්ද්‍රනාත් තාගොර්තුමා ( 1861 – 1941) අතර පැවති මිත්‍ර සම්බන්ධයට ද බුදු දහම හේතු විය.

බුදු දහම හා පාලි භාෂාව වැඩිදුර හැදෑරීම මුල් කර ගෙන විසිවන සියවසේ දී ශ්‍රී ලාංකික බෞද්ධ ගිහි - පැවිදි පඬිවරුන් හා ඉන්දියානු විද්වතුන් අතර පැවති ශාස්ත්‍රීය ගනුදෙනු ද ඉන්දු - ලංකා සබඳතා කෙරේ බලපෑවේය. උඩකැන්දවල සරණංකර හිමි, බඹරැන්දේ සිරි සීවලී හිමි, ආචාර්ය තෙන්නකෝන් විමලානන්ද වැනි ශ්‍රී ලාංකික විද්වත්හු ද රාහුල් සංස්කෘත්‍යායන, බී. ආර්. අම්බෙඩ්කාර් වැනි ඉන්දියානු විද්වත්හු ද වූහ. 1942 දී ඉන්දියාවේ ප්‍රථම ශ්‍රී ලංකා නියෝජිතයා ලෙස පත් වූ ඩී. බී. ජයතිලක මහතා ද බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කළ පඬිවරයෙක් විය.

යටත්විජිත භාවයෙන් මිදුණු පසුව ද රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ඉන්දු - ලංකා සංස්කෘතික සම්බන්ධතා වඩාත් පෝෂණය වුයේ බුදු දහම නිසා ය. බෞද්ධ ආරාම ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, සංස්කෘතික හුවමාරුව, පුරාවිද්‍යාත්මක සහයෝගීතාව, කපිලවස්තු සර්වඥ ධාතු ප්‍රදර්ශන වැනි කටයුතු නිසා දෙරට අතර ජනතාවගේ සබඳතා බුදු දහම මගින් ශක්තිමත් විය. 2017 වසරේ දී 14වන ජාත්‍යන්තර වෙසක් දිනය කොළඹ දී සමරන ලද්දේ ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතාගේ ප්‍රධානත්වයෙනි.

පෝක් සමුද්‍ර සන්ධියෙන් වෙන් වූ ශ්‍රී ලංකාවේ එක ම අසල්වැසියා ඉන්දියාව යි. දෙරට ම දකුණු ආසියාවේ උපායමාර්ගික ස්ථානයක් හිමි කර ගෙන ඉන්දියානු සාගරයේ කැපී පෙනෙන අතර බුදු දහමින් පෝෂිත ඉන්දු ලංකා සබඳතා ශක්තිමත් කරනු වස් දෙරට ම රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් කටයුතු කරයි. බුදු දහම ඉන්දු ලංකා සබඳතාවලට සදාකාලික දීප්තියක් ලබා දෙයි.

(මේ ලිපියේ කතුවරයා වන **මහාචාර්ය සඳගෝමි කෝපරහේවා** කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ අංශ ප්‍රධාන ධුරය හොබවන අතර සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානයේ සමාරම්භක අධ්‍යක්ෂවරයා ද වෙයි).





# කුසිනාරාවේ චෛත්‍ය ගෘහය - බුද්ධ පරිනිර්වාණය සිදු වූ ස්ථානය

උත්තර ප්‍රදේශ් හි කුසිනාරා නුවර චෛත්‍ය ගෘහය - බුදුන් වහන්සේ අසූ වැනි වියේදී පරිනිර්වාණයට පත් ස්ථානයේ පිහිටා ඇත. මෙය ද බෞද්ධයන්ගේ අති පූජනීය ස්ථාන හතරෙන් එකකි.



# ඉන්දීය හිමාලයේ වෙසක් සැමරුම්

***ආචාර්ය සෝනම් වැන්ග්චොක්***

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස*

*ඒ භාග්‍යවත් වූ, අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!*

සාමාන්‍යයෙන් සෑම වසරකම මැයි මාසයට යෙදෙන වෙසක් පුන් පොහෝ දිනය බුදුන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සිදුවීම් ත්‍රිත්වයක් සනිටුහන් කරන අතිශය වැදගත් දිනයකි. බුදුන් වහන්සේගේ උපත, සම්මා සම්බුද්ධත්වය සහ පරිනිර්වාණය සිදු වූයේ වෙසක් පුන් පොහෝ දිනක වීම එයට හේතුවයි. එබැවින් මෙම උතුම් දිනය ශාරීරික උපතක් පමණක් නොව ආධ්‍යාත්මික උපතක් සහ ආධ්‍යාත්මික ජයග්‍රහණයක් ද අනුස්මරණය කරන අතර එය ම ප්‍රීතියේ සහ සිහි කිරීමේ සංකේතයක් වේ. ලොව පුරා බෞද්ධයන්ට තෙමඟුල සමරන මෙම දිනය තරම් වැදගත් වන අන් දිනයක් නැත. බෞද්ධයන්ගේ වඩාත්ම වැදගත් උත්සවය වන වෙසක් මංගල්‍යය බෞද්ධයන් විසින් මහත් උද්යෝගයෙන් සමරනු ලබයි. විවිධ රටවල් විසින් විවිධාකාරයෙන් සමරනු ලබන වෙසක් උත්සවය විවිධ නම් වලින් ද හඳුන්වනු ලැබේ. හිමාලයේ වෙසෙන බෞද්ධයන් මෙය, “සග දව” යනුවෙන් හඳුන්වන අතර අග්නිදිග ආසියාතික රටවල් රැසක් වෙසක් දිනය යනුවෙන් හඳුන්වනු ලබයි. ඉන්දියාව පුරා මෙම දිනය පොදුවේ හඳුන්වන්නේ “බුද්ධ පූර්ණිමා” යනුවෙනි. මෙලෙස වෙසක් උත්සවය විවිධ නම් වලින් විවිධ රටවල දී සමරනු ලැබේ. බෞද්ධ ප්‍රජාව සියවස් ගණනාවක් පුරා මෙම උත්සවය සමරා ඇතැයි විශ්වාස කෙරේ.

බෞද්ධ ලෝකය සෑම වසරකම මෙම තෙමඟුල් දිනය මහත් ශ්‍රද්ධාවෙන් සහ භක්තියෙන් සමරනු ලබයි. ලොව පුරා වෙසෙන දහස් සංඛ්‍යාත බෞද්ධයෝ මෙම දිනයේ දී ආගමික කටයුතුවල නිරත වෙති. සැදැහැවත්හු පූජනීය ස්ථාන වැඳ පුදා ගනිති. මෙම දිනයේ දී බෞද්ධයෝ වෙහෙර විහාරස්ථානවලට ගොස් බුද්ධ, ධම්ම සහ සංඝ යන තෙරුවනට වැඳ නමස්කාර කරති. බෞද්ධ උපාසක උපාසිකාවන් අෂ්ඨාංග සීලය සමාදන් වන අතර අනෙකුත් ආධ්‍යාත්මික කටයතුවල ද නිරත වේ. ඇතැම් පුද්ගලයන් මත්පැන් පානය සහ දුම්බීම අත්හැරීමට අධිෂ්ඨාන කරගන්නා අතර ජීවිතයේ නව පිටුවක් පෙරළීමට උත්සහ කරයි. එය ලොව පුරා බෞද්ධයන්ට වඩාත්ම වැදගත් සහ ප්‍රීතිමත්ම දිනය වේ.

හිමාලයේ බෞද්ධයන් මුළු වෙසක් මාසයම පූජනීය කාලසීමාවක් ලෙස සලකන අතර එම මාසය පුරාම විවිධ ආගමික වතාවත් සිදු කරයි. පූජනීය ග්‍රන්ථ කියවීම සහ සිය ජීවන මාර්ගයන් ආලෝකවත් කළ බුදුන් වහන්සේට නමස්කාරයක් ලෙස බුදු මැදුරු සහ ආරාමයන්හි ගිතෙල් පහන් දැල්වීම යනාදිය ද මෙම ආගමික වතාවත්වල ට ඇතුළත් වේ. පරිත්‍යාගයන් සිදු කිරීම, ආගමික ස්මාරක ප්‍රදක්ෂිණා කිරීම සහ වැඳ පුදා ගැනීම යනාදිය මෙම පූජනීය මාසය තුළ බහුලව සිදු කරන කාර්යයන් වන අතර එමගින් අනාගතය යහපත් වන බව ඔව්හු විශ්වාස කරති. වැඩි වශයෙන් බෞද්ධයන් ජීවත් වන සිකිම්, ලඩාක්, අරුණාචල් ප්‍රදේශ්, හිමාචල් ප්‍රදේශ්, ඩාර්ජිලින්ග් සහ හිමාලයේ වෙනත් ප්‍රදේශයන් රැසක වෙසක් සැමරුම් විශාල වශයෙන් සිදු කරනු ලැබේ.

ලඩාක් හි වෙසක්/සග දව සැමරුම් ආරම්භ වන්නේ බුදුන් වහන්සේගේ පින්තූරයක් වාහනයක රැගෙන යන පෙරහැරකිනි. බෞද්ධ භික්ෂූන් වහන්සේලා, ගිහියන් සහ පාසල් සිසුන් මෙම පෙරහැරට සම්බන්ධ වේ. භික්ෂූන් වහන්සේලා සංගීත භාණ්ඩ වාදනය කරමින් ද ගිහි පින්වතුන් බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ කර්තව්‍යයන් දොළොස නිරූපිත පින්තූර සමඟින් පූජනීය ග්‍රන්ථ රැගෙන ද යන විචිත්‍රවත් පෙරහැර ගම් නගරවල වීදි සංචාරය කරයි. ආශිර්වාද ලබා ගැනීම සඳහා සහ බුදුන් වහන්සේට සිය නමස්කාරය පුද කිරීම සඳහා විශාල ජනකායක් මඟ දෙපස රැස් ව සිටිති. බෞද්ධයන් ආරාම සහ විහාරස්ථානයන් වෙත වන්දනා ගමන්හි ද නිරත වේ. මෙම විහාරස්ථාන ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීම වෙනුවෙන් නිර්මාණය කරන ලද විශේෂ කොඩි වලින් සරසා තිබේ. ගම්වැසියන්, විවිධ සංවිධාන සහ පුද්ගලයන් වන්දනාකරුවන්ට ආහාර පානාදියෙන් සංග්‍රහ කරයි. වන්දනාකරුවන්ට මෙයාකාරයෙන් සංග්‍රහ කිරීම පින් රැස් වන කටයුත්තක් බව විශ්වාස කෙරේ. දුප්පතුන්ට ආහාරපාන ලබා දීම, රෝහල්වල ප්‍රතිකාර ලබන රෝගීන්ට ඇප උපස්ථාන කිරීම, ලේ දන් දීම වැනි සමාජ සේවා කටයුතුවල නිරත වීමට ද මෙම දිනය යොදා ගනු ලැබේ.

ප්‍රධාන උත්සවය ලෙහ් හි ඓතිහාසික පෝලෝ ක්‍රීඩාංගනයේ දී පැවැත්වේ. එහිදී කලා ශිල්පීන් සහ විවිධ පාසල්වල ශිෂ්‍යයන් විසින් වර්ණවත් සංස්කෘතික වැඩසටහන් පවත්වනු ලබයි. ගෞතම බුදුන් වහන්සේගේ ජීවිත ඉතිහාසය විදහා දක්වන කෙටි ඉදිරිපත් කිරීම්, විද්වතුන් විසින් සිදු කරන දේශන සහ ධර්ම දේශනා යනාදිය ද මෙම උත්සවයේදී දක්නට ලැබේ. මෙම උතුම් දිනයේ දී සැදැහැවතුන්ගේ සිත්සතන් සහ මනස, සම්මා සම්බුද්ධත්වයට පත්ව සියලු සතුන්ගේ හිතසුව පිණිස ධර්මය දෙසා වදාළ බුදුන් වහන්සේ වෙත යොමු වේ.

මෙවන් සැමරුම් හිමාලයේ වෙනත් ප්‍රදේශවල ද දක්නට ලැබේ. සිකිම් හි සැමරුම් ආරම්භ වන්නේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් පූජනීය ග්‍රන්ථ සුක්ලඛන්ග් ආරාමයේ සිට ගැංග්ටොක් නගරය හරහා රැගෙන යන පෙරහැරකිනි. නළා ශබ්ද කිරීම, බෙර ගැසීම, සුවඳ කූරු දැල්වීම යනාදිය මෙම පෙරහැරේ දක්නට ලැබේ. දවස පුරා පැවැත්වෙන මෙම සැමරුම අවසාන වන්නේ ප්‍රීතියේ සහ සන්තුෂ්ඨියේ සංකේතයන්ගෙනි.

මෙම උත්සවය වෙසක්, බුද්ධ ජයන්ති, වෛශාඛ පූජා සහ සග දව යන විවිධ නම් වලින් හඳුන්වනු ලබයි. එසේ වුවත්, සැමරීමට හේතු පාදක වන කරුණු එකමය. මෙම උතුම් දිනයේ ප්‍රධානතම පණිවුඩය වන්නේ බෞද්ධයන් පාපයෙන් වැළකීමට සහ යහපතෙහි නිරත වීමට ද සිය මනස පවිත්‍ර කරගැනීමට ද දිරිගැන්වීමයි.

සියලු සත්වයෝ ප්‍රීතිමත් සහ සෞභාග්‍යමත් වේවා!

*ආචාර්ය සෝනම් වැන්ග්චොක්*



අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2017 මැයි මාසයේ පැවති 14 වන ජාත්‍යන්තර වෙසක් දින සැමරුමට සහභාගී වෙමින්

# ශ්‍රී ලංකාවේ බෞද්ධ වාස්තු විද්‍යාව හා භාරතීය ආභාසය



**වාස්තු විද්‍යාඥ ආචාර්ය නිලාන් කුරේ**

ක්‍රි. පූ. 3 වන සියවසේදී භාරතයේ ධර්මාශෝක අධිරාජයා විසින් මිහිඳු හිමියන් ඇතුළු ධර්මදූතයන් වහන්සේලා දිවයිනට වැඩම කරවා, රාජ්‍ය අනුග්‍රහය ද සහිතව බුදුදහම ස්ථාපිත කිරීමෙන් පසු බෞද්ධ වාස්තුවිද්‍යා සම්ප්‍රදායක් මෙරට බිහිවිය. උක්ත ධර්මදූත කාර්යයට පෙර බුදුන් වහන්සේ ජීවමානව වැඩ සිටි සමයේ තිරියාය ගිරිහඬු සෑය හා මහියංගන ස්තූපය ඉදිකරන ලද බැව් වංශකතාවල සඳහන් වුවද, ජීවමාන දහමකට අයත් පූජනීය වස්තූන් වන එකී ස්තූප කාලයත් සමග විකාශනය වී ඇති බැවින්, ඒවායේ මුල්කාලීන වාස්තුවිද්‍යා ලක්ෂණ පිළිබඳ අදහසක් ලබා ගැනීමට අපහසුය. බුදුදහම රාජ්‍ය අනුග්‍රහය සහිතව ස්ථාපිත වීමෙන් පසුව සැදැහැවතුන්ට වන්දනාමාන කිරීම සඳහා බුදුන් වහන්සේගේ ශාරීරික ධාතු නිදන් කරන ලද ස්තූපය පූජනීය වස්තුවක් ලෙසින් ඉදිකරනු ලැබූ අතර, ඉන් අනතුරුව ක්‍රි. පූ. 3 වන සියවසේදීම පාරිභෝගික ධාතුවක් වන ශ්‍රී මහා බෝධිය ද දිවයිනට වැඩම කිරීමෙන් පසුව බෝධිමාලක හා බෝධිඝර (බෝධීන් වහන්සේ වටා ඉදිවූ ගෘහය) යන නිර්මාණ අංග ඉදිවිය. මෙම කෙටි ලිපියේ අරමුණ වනුයේ ඉහතින් සඳහන් මුල්කාලීන පූජනීය වස්තූන්වල වාස්තු විද්‍යා ලක්ෂණ කෙරේ භාරතීය ආභාසයක් ලැබී තිබේදැයි සාකච්ඡා කිරීමය.

ශ්‍රී ලංකාවේ බුදුදහම නිල වශයෙන් ස්ථාපිත වූ පසු ඉදිකරන ලද ප්‍රථම ස්තූපය ථූපාරාම ස්තූපය වුවද, එකී ජීවමාන පූජනීය වස්තුව සියවස් ගණනාවක් පුරා විකාශනයට බඳුන් වී ඇති බැවින් වර්තමානයේදී එහි මුල්කාලීන වාස්තු විද්‍යා ලක්ෂණ හඳුනාගැනීමට නොහැකිව ඇත. නමුත් ක්‍රි. පූ. 1 වන සියවසට අයත් රඹුක්කන දැළිවල ස්තූපයේ සිදුකරන ලද පුරාවිද්‍යා කැණීම් හා පර්යේෂණ මෙන්ම එමගින් මතුවූ රන් ආලේපිත කරඬුව අනුව ද පෙනී යන්නේ, දැළිවල ස්තූපයේ අණ්ඩය (ගර්භය) පාමුල ප්‍රදක්ෂිණා කිරීම පිණිස ස්තූපයේ අණ්ඩයට ඒක කේන්ද්‍රීයව බිම් මට්ටමෙන් උස් වූ වෘත්තාකාර වේදියක් පැවති බවය. මෙම නිර්මාණ ලක්ෂණය සමකාලීන භාරතයේ පැවති අමරාවතී ස්තූප වාස්තු විද්‍යා සම්ප්‍රදායට සමාන බැව් පෙනේ. ඉහතින් සඳහන් කළ කරඬුව අනුව එකී වේදිය ගරාදි වැටකින් යුක්ත වූ බවද පෙනේ. එමෙන්ම වංශකතාවලට අනුව භාතික අභය රජු (ක්‍රි. පූ. 19 - ක්‍රි. ව. 9) මහා ස්තූපයට (රුවන්වැලිසෑයට) සාදන ලද කුච්චවේදියක් පිළිබඳව ද සඳහන්වේ. එබැවින් මෙරට මුල්කාලීන ස්තූපවල අණ්ඩය පාමුල පැදකුණු කිරීම පිණිස, භාරතීය ස්තූපවල මෙන් වෘත්තාකාර වේදියක් තිබූ බැව් පෙනී යයි. තවද, ස්තූපයේ අණ්ඩයේ මුදුන මත කුඩා ප්‍රමාණයේ තවත් වේදියක් (හර්මිකාවක්) ඉදිකර, එහි මධ්‍යයේ යූපගලක් පිහිටුවා, ඊට

ආසන්නයේ දණ්ඩක් මත ඡත්‍රයක් හෝ කිහිපයක් (ඡත්‍රාවලියක්) ඔසවා තිබූ බැව් ද, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල කරන ලද පුරාවිද්‍යා කැණීම් හා ඒවායෙන් මතුවූ කරඬු අනුව පෙනී යයි. එබැවින් මෙරට මුල්කාලීන ස්තූපවල උපරිව්‍යූහය භාරතයේ අදට ද ශේෂ වී ඇති සාංචි වැනි ස්ථූපවල උපරිව්‍යූහයට සමාන බැව් පෙනේ. පසුකලක මෙරට ස්තූපයේ වාස්තු විද්‍යාත්මක අංග විකාශනය වුවද, වර්තමානයේ පවා ස්තූපයේ හතරැස් කොටුවල ගඩොලින් හා කපරාරුවෙන් ගරාදි වැටක ලක්ෂණ නිරූපණය කිරීමෙන් පෙනී යන්නේ මුල්කාලීන භාරතීය වාස්තු විද්‍යා ලක්ෂණ යම් මට්ටමකට අදට ද ශේෂවී ඇති බවකි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ස්තූපය දේශීය අවශ්‍යතා අනුව පසුකාලීනව ශ්‍රී ලාංකික වාස්තු විද්‍යා අනන්‍යතාවයක් සහිතව ක්‍රමිකව විකාශනය වුවද, එහි මුල්කාලීන වාස්තු විද්‍යා ලක්ෂණ සඳහා භාරතීය ස්තූප වාස්තු විද්‍යා ආභාසය ලැබී ඇති බැව් පෙනී යයි.

එමෙන්ම ස්තූපය ආශ්‍රිතව පසුකාලීනව ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ වටදාගෙයෙහි වහලය කෝණාකාර හැඩයක් ගන්නා බැව් විද්වතුන් පෙන්වා දුන්නද, භාරතයේ විවිධ ස්ථානවල ඇති පැරණි චෛත්‍යශාලාවල වාස්තු විද්‍යා ලක්ෂණ හා සැසඳීමේදී පෙනී යන්නේ ඒවා අතර සංකල්පීය වශයෙන් සබඳතාවක් පවතින බවය. එබැවින් ශ්‍රී ලංකාවේ පසුකාලීනව නිර්මාණය වූ වටදාගෙයට ද යම් මට්ටමකට හෝ භාරතීය චෛත්‍යශාලාවල වාස්තු විද්‍යා ලක්ෂණවල ආභාසය ලැබී ඇති බව පෙනී යයි.

වර්තමානයේ නටබුන්ව පවතින ජේතවනයේ හා මහා විහාරයේ බෝධිමාලකවල ගරාදි වැට ද වාස්තු විද්‍යාත්මක වශයෙන් භාරතීය බෝධිමාලකවල පවතින ලක්ෂණ පෙන්නුම් කරයි. තවද, මෙරට ඓතිහාසික බෝධිඝරවල වාස්තු විද්‍යා ලක්ෂණ සමකාලීන භාරතයේ අමරාවතී, මථුරා, සාංචි, භාරුත් වැනි ස්ථානවල පවතින කැටයම් ඵලකවල නිරූපිත බෝධිඝරවල වාස්තු විද්‍යා ලක්ෂණ හා සංකල්පීය සබඳතාවයක් පැවතීමෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ බෝධිඝරයට ද භාරතීය වාස්තු විද්‍යාවේ ආභාසය ලැබී ඇති බවය.

තවද, මෑතකාලීනව පුරාවිද්‍යාඥයින් හා වාස්තුවිද්‍යා පර්යේෂකයින් විසින් ශ්‍රී ලංකාවේ පැරණි ස්තූප, වටදාගෙවල්, බෝධිමාලක හා බෝධිඝර වැනි පූජනීය වස්තූන් අර්ථකථනය සඳහා භාරතයේ එවන් පැරණි වාස්තු විද්‍යා ලක්ෂණ සහිත පූජනීය වස්තූන් අධ්‍යයනය කිරීම තුළින් ද පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ උක්ත පූජනීය වස්තූන්වල මුල්කාලීන වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට භාරතීය වාස්තු විද්‍යා ආභාසය ලැබී ඇති බවය.

**වාස්තුවිද්‍යාඥ ආචාර්ය නිලාන් කුරේ**

උප සභාපති


ස්මාරක හා ස්ථාන පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලයේ ශ්‍රී ලංකා කමිටුව



# නාලන්දා මහා විහාරය

බිහාරයේ නාලන්දා මහා විහාරය - බෞද්ධ දර්ශනය ගොඩනැගීම හා සම්බන්ධ ඉතිහාසයේ දී නාලන්දා මහා විහාරයට හිමි වන්නේ අතිශය වැදගත් ස්ථානයකි. නාලන්දා මහා විහාරය අවම වශයෙන් පස්වන සියවසේ සිට ශතවර්ශ අඩක් දක්වා සමස්ත ලෝකයේම ප්‍රමුඛතම සහ විශාලතම පර්යේෂණ සහ අධ්‍යාපන ආයතනය විය. ජපානය සහ කොරියාව වැනි දුර බැහැර රටවල විද්වතුන් පවා දුෂ්කර ගමනක යෙදී මෙහි අධ්‍යාපනය ලැබීමට පැමිණ තිබේ.

# ශ්‍රී ලංකා සහ ඉන්දීය සහෝදරත්වය



ආචාර්ය පූජ්‍යපාද බෝදාගම චන්දිම නාහිමිපාණෝ

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර දිගු කාලයක පටන් පවතින්නේ මිත්‍රශීලී සම්බන්ධතාවයකි. එකී සබඳතාවන් ආගමික, සංස්කෘතික, දේශපාලන, වෙළඳ ආදි විවිධ පැතිකඩ ඔස්සේ ගොඩනැගී ඇත. මෙම කෙටි ලිපියේ අරමුණ වනුයේ එකී සම්බන්ධතාවන් පිළිබඳ සිහිගැන්වීමයි. එහි ලා මහින්දාගමනය, දුමින්දාගමනය මෙන්ම වෙළඳ සම්බන්ධතා කෙරෙහි සැලකිල්ලක් යොමු කිරීමට කැමැත්තෙමි.

දීපවංශය සහ මහාවංශය වැනි ශ්‍රී ලංකාවේ පැරණි මූලාශ්‍ර වලට අනුව එම සම්බන්ධතාවය ආරම්භ වන්නේ මහින්ද තෙරණුවෝ ලක්දිවට වැඩම කරවීමෙනි. ඒ ආශ්‍රිතව සිදු වූ දේශපාලනික, ආගමික සහ සංස්කෘතිමය සිදුවීම් සහ වෙනස්වීම් පොදුවේ මහින්දාගමනය ලෙස හැඳින්වේ. එතැන් සිට ලක්දිව සංස්කෘතිය, සිරිත් විරිත්, අධ්‍යාපනය, ජීවන ක්‍රමය, සමාජ රටාව, ආර්ථිකය සහ පාලන ක්‍රමය පෙරළියකට ලක් වෙයි. මහින්දාගමනය ලක්වැසි ජනතාවගේ භෞතික හා ආධ්‍යාත්මික දිවි පෙවෙත කෙරෙහි අතිශය ප්‍රබල බලපෑමක් ඇති කළේය. ආදී මිනිසා විමුක්තිය අරමුණු කර ගනිමින් විවිධ අදෘශ්‍යමාන බලවේගයන්ට හා විශ්වාසයන්ට නැඹුරු වුවත් ඉන් ඔවුන් ලත් විමුක්තියක් නොමැත්තේය. සැබෑ විමුක්තිය ළඟා කර ගන්නට නිවැරදි දර්ශනයක් හා පැහැදිලි චින්තනයක් අවැසි විය. අරහත් මහින්ද හිමිගේ පැමිණීමට පෙර දිවයිනේ පැවති ආගමික තත්ත්වය පිළිබඳව සමීක්ෂණය කළ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කොමසාරිස් ආචාර්ය සෙනරත් පරණවිතාන මෙසේ පවසයි: “අශෝකගේ මිෂනාරිවරුන් බුදු දහම දේශනා කළ විට පැහැදිලි වේ. ගංගා, විල්, කඳු, ගස් ආදියෙහි වාසය කළ යුතු යක්ෂයන් නමින් හැඳින්වෙන අය සොබාදහමේ ආත්මයන්ට බහුතරයක් නමස්කාර කළ බවයි”. බුදු දහමේ ඉගැන්වීම් හරහා මෙරට ජනයා අලුතෙන් සාම්ප්‍රදායික ඇදහිලි වලින් මිදී සිතන්නට පුරුදු වූ බව පෙනේ. ඒ මහින්දාගමනය මගිනි. වර්තමාන ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රබෝධයේ ආරම්භය එයම විය. මිනිසාගේ චින්තන ශක්තිය මුහුකුරා යන්නට මහින්දාගමනය අතිශයින්ම බලපෑවේය. ධර්මාශෝක අධිරාජ්‍යයා එකල ඉන්දියානු පාලකයා වශයෙන් ශ්‍රී ලංකාව සමඟ මිත්‍රත්වය ගොඩනැගුවේ බුදුදහම හරහා ඒ වටිනා බුද්ධ දේශනාව දායාද කරමිනි.

මහින්ද තෙරණුවෝ ලක්දිවට වැඩමවීමෙන් පසු සංඝමිත්තා මහ රහත් තෙරණිය විසින් ඉන්දියාවේ ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාවට වැඩම කරවීමත්, ශ්‍රී ලංකා රාජ්‍යය තුළ බෞද්ධ සිද්ධස්ථාන ඉදිකිරීම ආරම්භ වූ බවත් සඳහන් වෙයි. ඒවා අතරින් ඉසුරුමුණි විහාරය සහ වෙස්සගිරිය විහාරය අදටත් වැදගත් වන්දනාමාන ස්ථාන වෙයි. තෙරණියගේ ලංකාගමනේදී ශ්‍රී ලාංකීය බෞද්ධ ජනතාවට වන්දනාමාන කිරීම සඳහා බුද්ධත්වයේ දී සෙවණ දුන් බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාවට ගෙනෙන ලදී. මෙම බෝධි ශාකයේ විශේෂත්වය වන්නේ බුදුන් වහන්සේ පිරිනිවන් පානා මොහොතේ ප්‍රකාශ කළ පරිදිම බෝ අත්ත මව් ශාකයෙන් ඉබේම වෙන්වී රන් බඳුන තුළ පිහිටීමයි. පසුව මෙම බෝ පැළය සහිත රන් බඳුන සංඝමිත්තා තෙරණිය විසින් දේවානම්පිය තිස්ස රජුට භාරදෙන ලදී. එය අනුරාධපුරයේ මහමෙව්නාවේ රෝපණය කරන ලදී. ලාංකික බෞද්ධ ජනතාව ඉතාමත් ගෞරවයෙන් වන්දනාමාන කරන මෙම බෝධීන් වහන්සේ වර්තමානය වන විටත් නොනැසී පවතී. සෑම වසරකම උඳුවප් මස පොහෝ දිනයේදී (දෙසැම්බරයේදී) මෙම බෝධිය ඉතා උත්සවශ්‍රීයෙන් වන්දනාමාන

තව ද ඒ සමඟම සිදු වූ වටිනාම දෙය නම් දහ අට කුලයක ශිල්පීන් මෙරටට පැමිණීමයි. ඔවුන්ගේ ශිල්ප ශාස්ත්‍ර ඔස්සේ මෙරට ජනයාගේ වෘත්තීය කුසලතා වර්ධනය විය. එය ජන සමාජයේ නව හැරවුම් ලක්ෂයක් විය.

තව ද දළදා වහන්සේගේ වැඩමවීම තුළින් ඉන්දියාව සහ අපේ රට අතර සහෝදරත්වය ශක්තිමත් වූ බවට සැක නැත. ඉන්දියාව සතුව තිබූ වටිනාම වස්තුව ලෙස දළදා වහන්සේ සැලකූ බව නොරහසකි. නොයෙක් දේශපාලන අරගල නිසා හිරිහැර වලින් ආරක්ෂා කරගැනීමට දළදා වහන්සේගේ පූජනීයත්වයේ වටිනාකම රැකගැනීමට ඉන්දියාව සතුව සිටි එකම විශ්වාසවන්ත මිතුරා මෙන්ම සහෝදරයා ශ්‍රී ලංකාව විය. අදටත් දළදා වහන්සේ මෙරට ජීවමානව වැඩ සිටීම එකී විශ්වාසය මැනවින් පෙන්වා දෙන්නකි. හේමමාලා හා දන්ත කුමරු යුවතිපතීන් දෙදෙනාම ඉන්දීය රජ කිරුළ හිමි කුමර කුමරිවරුන්ය. එමෙන්ම මිහිඳු මාහිමියන් සහ සංඝමිත්තා තෙරණිය ද ඉන්දීය කිරුළේ උරුමකරුවන් විය. එකී උරුමකරුවන් හරහාම අපේ රටට වටිනා පූජනීය වස්තූන් දායාද කිරීමම තුළින් කෙතරම් දේශපාලනික මෙන්ම ආගමික එකමුතු බවක් එකල තිබුණේදැයි වටහා ගැනීම අපහසු නොවේ.

දෙරට අතර සමාන වාර්ගික හා සංස්කෘතික බැඳීම් තිබේ. මුළු ජනගහනයෙන් බහුතරයක් වන සිංහල ජනතාව පැවත එන්නේ ක්‍රි. පූ. 543 සිට ක්‍රි. පූ. 243 දක්වා දිවයිනට සංක්‍රමණය වූ උතුරු ඉන්දියානු ඉන්දු ආර්ය පදිංචිකරුවන්ගෙනි. දෙමළ ජනතාව ද්‍රවිඩ කණ්ඩායමට අයත් වන අතර ඔවුන් දිවයිනට සංක්‍රමණය වී ඇත. ශ්‍රී ලංකාවේ ආසන්නතම අසල්වැසියා ඉන්දියාව වන අතර දෙරට එකිනෙක වෙන්වන්නේ පෝක් සමුද්‍ර සන්ධිය හරහායි.

ඉන්දියානු වෙළෙන්දෝ වසර 2500කට වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවට පැමිණ පදිංචි වී සිටිති. ක්‍රිස්තු පූර්ව සියවස්වල සිට ශ්‍රී ලංකා රජවරු දකුණු ඉන්දියානු ශ්‍රමයේ සේවය භාවිතා කළහ. ප්‍රාථමික මූලාශ්‍රය වන මහාවංශයට අනුව, වර්තමාන තමිල්නාඩුවේ පාණ්ඩ්‍ය රාජධානියේ සේවා කණ්ඩායම් ගණනාවක් ප්‍රාකෘත භාෂාව කතා කරන ජනයා විසින් අනුරාධපුර ජනාවාස ගොඩනැගීම සඳහා ශ්‍රම දායකයන් ලෙස පැමිණියහ.

ශ්‍රී ලාංකිකයන් විශේෂයෙන් ශ්‍රී ලාංකික බෞද්ධයන් ඉන්දියාවේ සංචාරය කරන්නේ බෞද්ධ පූජනීය ස්ථාන වන බුද්ධගයාව, කුසිනාරාව, වරණාසි සහ වෙනත් බෞද්ධ ස්ථාන නැරඹීමටය. මෙය දෙරටේම සංචාරක කර්මාන්තයට රුකුලක් වී ඇත.

යථෝක්ත කරුණු සලකා බැලීමේදී ඉතා මැනවින් පැහැදිලි වනුයේ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආගමික, දේශපාලනික, සංස්කෘතික ආදි වශයෙන් අනෙකුත් රටවලට වඩා නෑදෑකමක් තිබූ බවයි. එබැවින් දෙරටේම පුරවැසියන් ලෙස අප සියලු දෙනාම ගෞතම බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් පරිදි මෛත්‍රිය, කරුණාව, මුදිතාව සහ උපේක්ෂාදී ආධ්‍යාත්මික ගුණධර්ම දියුණු කරමින් එකට එක්විය යුතු කාලෝචිත යුගයක් පැමිණ ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

**ආචාර්ය පූජ්‍යපාද බෝදාගම චන්දිම නාහිමිපාණෝ**
**උප කුලපති**
**නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය,**
**මානෙල්වත්ත, බොල්ලෑගල, කැළණිය**

# විද්‍යාලංකාර පිරුවනින් ආලෝකය ලැබූ භාරතීය පඬිවරු



**විශ්‍රාන්ත ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ**

ව්‍යවහාර වර්ෂ 1875 නොවැම්බර් මස 01වැනි දින රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නායක ස්වාමීන් වහන්සේ විසින් පිහිටුවා වදාළ ‘පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන’ මේ වන විට අවුරුදු 146ක ඉතිහාසයකට හිමිකම් කියන්නේය. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ පුරෝගාමිත්වයෙන් ඇරඹුණු සම්භාව්‍ය අධ්‍යාපනය පුනරුත්ථාපනය කිරීමේ අති උදාර කර්තව්‍යය තවතවත් ඉදිරියට ගෙන යෑමත්, තහවුරු කිරීමත් අරමුණු කොට ගෙන බිහි වූ විද්‍යාලංකාර පිරිවෙන ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන බෞද්ධායතනයක් වශයෙන් වර්තමාන ශාස්ත්‍රීය ලෝකයේද අතිමහත් ගෞරවාදරයට පාත්‍ර වී ඇත්තේය. වසර 146ක් යනු සුළු කොට තැකිය හැකි කාලයක් නොවේ. මෙවැනි දීර්ඝ කාලයක් තිස්සේ ශාස්ත්‍රීය සේවයම අරමුණු කොට ගෙන ආයතනයක් පවත්වාගෙන ඒමම අතිශය දුර්ලභ සිදුවීමක් ලෙස හැඳින්වීම අතිශයෝක්තියක් වන්නේ නැත. එහෙන්ම, හුදු ශාස්ත්‍රීය ලෝකයේ පමණක් නොව ආගමික, සාමාජික, සංස්කෘතික සහ දේශපාලන ක්ෂේත්‍රවල විවිධ ප්‍රශ්න සම්බන්ධයෙන්, වෙසෙසින්ම ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් වූ විද්‍යාලංකාර පිරිවෙනේ භූමිකාව හා දායකත්වය ලක් ඉතිහාසයේ රන් අකුරින් ලියවෙන්නකි.

ධර්ම-ශාස්ත්‍රීය සේවය මූලික වූ විද්‍යාලංකාරය නමැති විද්‍යා ප්‍රදීපයේ ආලෝකය ලක්දිව පමණක් නොව අන්‍ය දේශ-දේශාන්තරවලටද පැතිරී යෑම තවත් විශේෂ කරුණක් ලෙස සැලකිය යුත්තකි. විද්‍යාලංකාර ඉතිහාසයට අනුව මේ සියලු අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීමේ ලා අතිශය උදාර කැපවීමකින් කටයුතු කළ පරිවේණාධිපතීන් වහන්සේලා සදෙනෙක් වෙති; එනම්,

1. පණ්ඩිතාචාර්ය පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (1875-1887)

2. පණ්ඩිත සාර්වභෞම පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (1887-1918)

3. පණ්ඩිත ශිරෝමණි පූජ්‍ය ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමීන් වහන්සේ (1918-1945)

4. ආගම චක්‍රවර්ති පූජ්‍ය කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (1945-1959)

5. සාහිත්‍ය චක්‍රවර්ති පූජ්‍ය යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (1959-1986)

6. විනයාචාර්ය පූජ්‍ය නාත්තන්ඩියේ ප්‍රඥාකර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (1986-1990)

මේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා සියලු දෙනාම ඉතා විශිෂ්ට විද්වතුන් ලෙස විදවත් සමාජයේ පිළිගැනීමට ලක්වී තිබිණි. මෙහි ඇති අතිශය වැදගත් කරුණ ලෙස පෙනී යන්නේ තමන් වහන්සේලා විසින් ප්‍රත්‍යක්ෂ කොට සාක්ෂාත් කර ගනු ලැබූ ධර්ම-ශාස්ත්‍ර අන් අය වෙත නිර්ලෝභීව ප්‍රදානය කිරීමෙන් උන්වහන්සේලා දැක්වූ අපරිමිත යහගුණයයි. ආත්මාර්ථයම එකම දහම ලෙස අදහමින් අවස්ථාවාදය ජීවන චර්යාව කර ගත් බොහෝ දෙනෙකු සිටින සමාජයක මෙවැනි සංඝ පීතෘන් වහන්සේලා බිහි වීම තරමක හෝ සැලසිල්ලකට හේතු වන්නේමය.

විද්‍යාලංකාර පිරිවෙනෙහි තෙවන පරිවේණාධිපතීන් වහන්සේ වශයෙන් වැඩ වදාළ පූජ්‍ය ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ කාල පරිච්ඡේදය වන 1918-1945 දක්වා වූ කාලවකවානුව විද්‍යාලංකාරයේ කටයුතු ජාත්‍යන්තර මට්ටමට පත් වූ අවධිය ලෙස හැඳින්විය හැකිය. භාරතය, නේපාලය, චීනය, අවුස්ත්‍රියාව, ලාඕසය, තායිලන්තය, ඕලන්දය, ඇමරිකාව, එංගලන්තය ආදි පෙරපර දෙදිගම රටවල් රාශියක විද්වත් පඬිවරුන් විද්‍යාලංකාරයට පැමිණීම අතිශය විශේෂ වැදගත් සිදුවීමක් ලෙස සැලකීම යුක්තියුක්තය. වෙසෙසින්ම භාරතය සමග ඇති වුණු සම්පර්කය හුදු ධර්ම- ශාස්ත්‍රීය අධ්‍යයනයන්ට සීමා වූවක් නොවූ අතර, එය භාරතයේ නව බෞද්ධ පුනරුදයක් ඇති කිරීමේ ලා අති විශිෂ්ට දායකත්වයක්ද සැපයුවේය.

භාරතයෙන් විද්‍යාලංකාරයට පැමිණි විද්වතුන් අතර 'කේදාර්නාථ් පාණ්ඩේය්' හෙවත් 'රාමෝදාර් සාධු' යන නමින් පැමිණ මෙහිදී පැවිදි වූ 'පණ්ඩිත රාහුල් සාංක්‍රිත්‍යායන් ස්ථවිරයන් වහන්සේ', 'ආනන්ද කෝසල්‍යායන් ස්ථවිරයන් වහන්සේ' 'ජග්දීශ් කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ', 'ශාන්ති භික්ෂු ශාස්ත්‍රී පඬිතුමා', 'ශාණ්ඩිල්‍යායන රට්ඨපාල ස්ථවිරයන් වහන්සේ', 'විසුද්ධානන්ද ස්ථවිරයන් වහන්සේ', 'ශීතල් ප්‍රසාද් ජෛන සාධු', 'කත්මණ්ඩුවේ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ', 'බෙංගාලයේ සුධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ', 'අධීර්චන්ද්‍ර බැනර්ජී මහතා', ශ්‍රී ඥාන භික්ෂු බ්‍රහ්මානන්ද පඬිතුමා', 'නාගාර්ජුන් වාත්ස්‍යායන් ස්ථවිරයන් වහන්සේ', 'සත්‍ය ස්වරූප් ශාස්ත්‍රී මහතා', 'ශ්‍රී ක්‍රිෂ්ණ මහතා', 'සුශීල් කුමාර් මහතා', 'සාවංගියේ මේධංකර ස්ථවිරයන් වහන්සේ', දක්ෂිණ භාරතයේ අනන්ත්රාම්භට්ට පඬිතුමා, ආචාර්ය සත්‍ය නාරායණ් මහතා ආදි වශයෙන් නම් රාශියකි. මේ අය අතරින් හින්දි සාහිත්‍යයේ ප්‍රදීපස්ථම්භ ලෙස සැලකිය හැකි තිදෙනෙක් වෙති, එනම්, රාහුල් සාංක්රිත්යායන් පඬිතුමා, ආනන්ද කෝසල්‍යායන් ස්ථවිරයන් වහන්සේ සහ නාගාර්ජුන් වාත්ස්‍යායන් හෙවත් බාබා නාගාර්ජුන් ආදි වශයෙනි.

පූජ්‍ය ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විද්‍යාලංකාර පරිවේණාධිපති වශයෙන් කටයුතු කරමින් වෙසෙසින්ම භාෂා-ශාස්ත්‍ර දියුණුවට මං සොයමින් සිටි අවධියක සංස්කෘත භාෂාව ඉගැන්වීම සඳහා භාරතයෙන්ම පඬිවරයකු ගෙන්වා ගැනීම උන්වහන්සේගේ මූලික අරමුණක් වී තිබිණි. ඒ සඳහා භාරතයේ පුවත්පතක දැන්වීමක්ද පළ කෙරිණි. එය දුටු හින්දු සාධුවරයකු ලෙස කටයුතු කරමින් සිටි 'කේදාර්නාථ් පාණ්ඩේය්' හෙවත් 'රාමෝදාර් සාධු' (රාහුල් සාංක්රිත්යායන් පඬිතුමා) ලංකාවට පැමිණීම සඳහා උත්තර භාරතයේ බිහාර් ප්‍රාන්තයේ ඡප්රා දිස්ත්‍රික්කයේ සිට දුම්රියෙන් ගමන් ආරම්භ කොට 1927 මැයි 16වන දින ලංකාවේ කැලණිය දුම්රිය ස්ථානයට සම්ප්‍රාප්ත වූවේය. එහි සිට මග විමසමින් දුම්රියපොළ අසලම පිහිටි විද්‍යාලංකාර පිරිවෙනට පැමිණි 'දඹදිව බ්‍රාහ්මණ පඬිතුමා' ඉතා ඉහළින් පිළිගනු ලැබිණි. සංස්කෘත ඉගැන්වීම වෙනුවෙන් ගෙවිය යුතු වේතනය විමසීමේදී පඬිතුමා ප්‍රකාශ කළේ "මට වැටුපක් අවශ්‍ය නැහැ. කෑම, ඇඳුම්, පොත්පත් සපයා දීමත්, විශේෂයෙන් පාලි භාෂාව ඉගෙනීමට අවශ්‍ය පහසුකම් සපයා දීමත් කළොත් මට ඒ ඇති" යනුවෙනි. මේ පිළිතුර එතුමාගේ සැබෑ ශාස්ත්‍රකාමිත්වය ප්‍රකට කරන්නක්ම විය. එතුමා විසින් ලියන ලද සිය චරිතාපදානයේ මෙසේ සඳහන් වෙයි; 'එක් අතකට මගේ සාහිත්‍ය ජීවිතය ආරම්භ වූයේ ක්‍රි. ව. 1927දී යැයි කීම නිවැරදිය. එනම් විද්‍යාලංකාරයට පැමිණීමෙන් පසුවය.' ඉතා කෙටි කලකින්ම ත්‍රිපිටකය හැදෑරූ එතුමාට 1928දී විද්‍යාලංකාරය මගින් 'ත්‍රිපිටකාචාර්ය උපාධිය' ප්‍රදානය කරන ලදි. බෞද්ධ දර්මය කෙරෙහි එතුමා කෙතරම් පැහැදුණේද යත්, 1930 ජූලි 30වැනි දින 'ශ්‍රී රාහුල් සාංක්රිත්‍යායන්' නමින් විද්‍යාලංකාරයේදීම ප්‍රව්‍රජ්‍යා දිවියට ඇතුළත් වූහ. මෙසේ ආරම්භ වන එතුමාගේ සාහිත්‍ය ජීවිතය විද්වත්

ලෝකයේ කිසිවෙකුට ළං විය නොහැකි ඉමක් කරා ගෙන යෑමේ ලා විද්‍යාලංකාරයේ භූමිකාව අතිශය වැදගත් වූ බව පැහැදිලිවම පෙනී යයි.

වරෙක එවකට සොයා ගත නොහැකිව තිබුණු සංස්කෘත බෞද්ධ ග්‍රන්ථ සොයා බොහෝ දුෂ්කර මාර්ග ඔස්සේ අනේක දුෂ්කරතා විඳිමින් තිබ්බතයට ගිය රාහුල් පඬිතුමාට පොත් මිලදී ගැනීම සඳහා තිබුණු මුදල් ප්‍රමාණවත් නොවූයෙන් වහාම ලිපියකින් තම අවශ්‍යතාව ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමීන් වහන්සේ වෙත දන්වනු ලැබිණි. උන්වහන්සේ මේ කර්තව්‍යයේ වැදගත්කම සලකා විද්‍යාලංකාරයේ දායක-කාරකාදීන්ගෙන් මුදල් සපයා ගෙන වහාම තිබ්බතයට යැවූහ. රාහුල් පඬිතුමා තිබ්බතයෙන් සොයා ගත් ආචාර්ය ධර්මකීර්ති ආදි මහා දාර්ශනිකයන්ගේ අප්‍රකට සංස්කෘත බෞද්ධ ග්‍රන්ථ රාශිය ශාස්ත්‍රීය ලෝකයට දායාද කිරීම සඳහා විද්‍යාලංකාරය එදා දැක්වූ සක්‍රිය සහයෝගය මෙයින් ප්‍රකට වෙයි. එමෙන්ම රාහුල් පඬිතුමා අතින් ත්‍රිපිටක ග්‍රන්ථ රාශියක් හින්දී භාෂාවට පරිවර්තනය කෙරිණි. මේ සියල්ලෙහිම ගෞරවය ලැබෙන්නේ විද්‍යාලංකාරයටමය. විද්‍යාලංකාර පිරිවෙන විශ්වවිද්‍යාලයක් බවට පත්වූ අවස්ථාවේදී දර්ශන අධ්‍යයනාංශයෙහි ප්‍රථම මහාචාර්යවරයා වශයෙන් රාහුල් පඬිතුමා නැවත ලංකාවට පැමිණියේ. මූලික උපාධි කිසිවක් නොමැතිව මහාචාර්ය පදවියකට පත් වීමට තරම් විශිෂ්ට විද්වතෙකු බවට පත් වන්නට එතුමාට මග පෑදුවේ විද්‍යාලංකාර පිරිවෙන යැයි කීම අතිශයෝක්තියක් නොවේ. එවක භාෂා පීඨාධිපතිවරයා වශයෙන් කටයුතු කළ සිංහල පිළිබඳ මහාචාර්ය පූජ්‍ය කොටහේනේ පඤ්ඤාකිත්ති ස්වාමීන් වහන්සේ රාහුල් සාංක්‍රිත්‍යායන් පඬිතුමා ගැන මෙසේ සඳහන් කරති:

'...ත්‍රිපිටකාචාර්ය රාහුල් සාංක්‍රිත්‍යායන් පඬිතුමා ලෝක විශ්‍රැත පර්යේෂකයෙකි. කීර්තිධර බෞද්ධ දාර්ශනිකයෙකි. වර්තමාන හින්දී ලේඛකයන් අතර අද්විතීය ලේඛකයෙකි. ත්‍රිපිටක ග්‍රන්ථාවලිය හින්දී භාෂාවට පෙරළීමට මුල් වූයේ මෙතුමාය.

රුසියාවේ ලෙනින්ග්‍රාඩ් විශ්වවිද්‍යාලයෙහි බෞද්ධ දර්ශනය පිළිබඳ ආචාර්ය පදවිය ද කලක් දැරූ මේ මහතා ආචාර්ය රාජේන්ද්‍ර ප්‍රසාද් රාෂ්ට්‍රපතිතුමාගේ හිතෛෂී මිත්‍රයෙකි. බුද්ධගයා කොමිසමේ සිටි මේ දෙපොළම බෞද්ධයන්ට පක්ෂව ක්‍රියා කළහ. ඉන්දියාවේ නිදහස සඳහා ක්‍රියා කොට බන්ධනාගාරයට කිහිපවරක්ම හසු වූ මේ පඬිවරයා ජනප්‍රිය නායකයෙකි.

සාංක්‍රිත්‍යායන් පඬිතුමා පෙරපරදිග භාෂා කිහිපයක ධුරන්ධර පඬිවරයෙකි. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙහි දර්ශනය පිළිබඳ මහාචාර්ය පදවියට පත් මේ මහා පඬිවරයා ඉන්දියාණ්ඩුවෙන් තමාට පවරා ඇති කර්තව්‍යයක් නිසා මේ සැප්තැම්බර් මාසයේ දී ලංකාවට එන බව මට ගිය සතියේ එවූ ලිපියක සඳහන් කරයි. ...'

රාහුල් පඬිතුමා විසින් හින්දියට අනුවාදිත ග්‍රන්ථ අතර 'මජ්ඣිම නිකාය', 'දීඝ නිකාය', 'විනය පිටකය', 'පාතිමොක්ඛ', 'මහාවග්ග', 'චුල්ලවග්ග', 'පරිවාර', 'ධම්මපදය' ආදිය දක්නට ලැබෙන අතර, එතුමා විසින් හින්දියෙන් විරචිත කෘති අතර 'බුද්ධ චර්යා', 'ලංකාව', 'ටිබෙට් රටේ බුද්ධාගම', 'ටිබෙට් භාෂාව ප්‍රථම පුස්තකය, ද්විතීය පුස්තකය, තෘතීය පුස්තකය', 'ටිබෙට් ව්‍යාකරණය', 'මගේ ටිබෙට් ගමන', 'ටිබෙට් රටේ අවුරුද්දක්', 'මගේ යුරෝපා ගමන', 'කුරාන් පොතේ සාරය', 'පුරාවිද්‍යා නිබන්ධ', '22වැනි ශතවර්ෂය', 'සමාජවාදයම අවශ්‍ය ඇයි?', 'බෞද්ධ දර්ශනය', 'විග්‍රව්‍යාවර්තනී', 'ප්‍රමාණවාර්තික', 'වොල්ගා සේ ගංගා තක් (වොල්ගා ගඟේ සිට ගංගා නම් ගඟ තෙක්)', 'භාගෝ නහීං දුනියා කෝ බද්ලෝ (පලා නොයනු ලෝකය වෙනස් කරනු)', 'මේරී ජීවන් යාත්‍රා (මගේ ජීවිත යාත්‍රාව)', 'ජින්කා `මෑ ක්‍රිතගා හූ (ඔහුට මම කෘතඥ වෙමි)' 'මහා මානව් බුද්ධ් (මහා බුද්ධ මානයාණෝ)' ආදිය ප්‍රකටය. 'අභිධර්මකෝෂ', 'වාද න්‍යාය',

'වාර්තිකාලංකාර' යන කෘති සංස්කෘත භාෂාවෙන් රචනා කර ඇති අතර, සංස්කෘත භාෂාව ඉගැන්වීම සඳහා 'සංස්කෘත ප්‍රථම පුස්තකය, ද්විතීය පුස්තකය හා තෘතීය පුස්තකය' යන නමින් සිංහල භාෂාවෙන් කෘති තුනක්ද රචනා කරන ලදි. රාහුල් පඬිතුමා අවසන් වරට ලංකාවෙන් පිටවී ගියේ 1961 අගෝස්තු මාසයේදීය.

රාහුල් පඬිතුමා සම්බන්ධ වැදගත් කාරණයක් මේ අවස්ථාවේදී මගේ සිහියට නැගෙයි. නවදිල්ලියේ ජවාහර්ලාල් නේහ්රූ විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් සිටි කාලයේදී 'රාහුල් සාංක්‍රිත්‍යායන් පදනම' මගින් සංවිධානය කෙරුණු වාර්ෂික සාහිත්‍ය සම්මන්ත්‍රණවලදී 'විද්‍යාලංකාර' නාමය රැව්පිළිරැව් දෙනු අයුරු අසා ඇත්තෙමි. පොත් 150කට වඩා රචනා කර ඇති ලෝක පූජිත රාහුල් පඬිතුමා වැන්නෙකුට ගෞරව කෙරෙන සෑම අවස්ථාවකදීම 'විද්‍යාලංකාර නාමය' සිහිපත් කරන්නට සිදු වීම ශාස්ත්‍රීය ලෝකයට විද්‍යාලංකාරය විසින් ලබා දෙන ලද්දා වූ අමිල සේවාව යළි යළිත් සිහිපත් කිරීමක්ම වෙයි.

භදන්ත් ආනන්ද් කෝසල්‍යායන් හෙවත් ත්‍රිපිටකාචාර්ය, හින්දී මහාචාර්ය ආනන්ද කෝසල්‍යායන් ස්ථවිරයන් වහන්සේ රාහුල් පඬිතුමාගේ ඉමහත් අනුබලයෙන් විද්‍යාලංකාරයේදී පැවිදි දිවියට පත් වූහ. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය ආරම්භ වීමෙන් පසු හින්දී අධ්‍යයනාංශයේ ප්‍රථම හින්දී මහාචාර්යවරයා වූයේ මුන් වහන්සේය. මහාචාර්ය පූජ්‍ය කොටහේනේ පඤ්ඤාකිත්ති ස්වාමීන් වහන්සේ ආනන්ද් කෝසල්‍යායන් ස්ථවිරයන් ගැන මෙසේ සඳහන් කරති:

> 'හින්දී සාහිත්‍ය ප්‍රචාරයෙහි පුරෝගාමියකු වූ ආනන්ද කෞශල්‍යායන් ස්ථවිරයන් වහන්සේ විද්‍යාලංකාර පිරුවන්හි පැවිදි වූ භාරතීය පඬිවරයන් අතර සිටින පළමුවැන්නාය. ජාතකට්ඨකථාව, මහාවංසාදි පාළි පොත් කීපයක් ම හින්දියට පෙරළූ මුන්වහන්සේ මෙකල සිටින විශිෂ්ට හින්දී ලේඛකයෙකි. පෙරපරදිග බොහෝ රටවල ධර්ම ප්‍රචාරය සඳහා ගිය මේ පඬිවරයා විද්‍යාලංකාර පරිවේණාධිපතිව වැඩ සිටි ශ්‍රී ධර්මානන්ද මාහිමියන්ගේ ශිෂ්‍යවරයෙකි. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ හින්දී භාෂාව පිළිබඳ මහාචාර්ය ධුරයේ වැඩ භාර ගැනීමට මුන්වහන්සේ මේ මස 11 වෙනි දින විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට පැමිණියහ.'

කෝසල්‍යායන හිමිපාණන් අතින් හින්දී භාෂාවට නැගුණේ පාලි පොතපත පමණක් නොවේ. උන්වහන්සේ අතින් හින්දියට නැගුණු සිංහල සාහිත්‍ය කෘති අතර මාර්ටින් වික්‍රමසිංහයන්ගේ 'ගම්පෙරළිය' (ගා`ව් කා රූපාන්තරණ්), විශේෂයෙන් වැදගත් වෙයි. 'තුන්සරණය', 'බුදුගුණාලංකාරය', 'මහාවංශය', 'අංගුත්තර නිකාය' මෙන්ම ළමුන් සඳහා 'උම්මග්ග ජාතකය' ආදි කෘති රැසක්ද උන්වහන්සේ අතින් හින්දී බසට පෙරළුණි. 'යදි බාබා න හෝතේ (බාබා අම්බේඩ්කර් නොසිටින්නට)', 'ලංකා', 'භග්වාන් බුද්ධ් ඖර් උන්කා ධර්ම් (බුදුන් වහන්සේ සහ උන්වහන්සේගේ ධර්මය)', 'සිංහල් භාෂා ඖර් සාහිත්‍ය (සිංහල භාෂාව සහ සාහිත්‍යය)', 'පාලි-හින්දී ශබ්දකෝශ් (පාලි-හින්දී ශබ්දකෝෂය)' ආදියද උන්වහන්සේ අතින් විරචිත ග්‍රන්ථ වෙයි. පාලි ජාතකට්ඨ කථාව හින්දී බසට පෙරළා කාණ්ඩ 9කින් ප්‍රකාශයට පත් කිරීම උන්වහන්සේ අතින් සාහිත්‍ය ලෝකයට ලැබුණු මාහැඟි දායාදයක් ලෙස සැලකෙයි.

ජග්දීශ් කාශ්‍යප ස්ථවිරයන් වහන්සේද ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබූ භාරතීය පඬිවරයෙකි. 'සංයුක්ත නිකාය', 'මිලින්ද ප්‍රශ්නය', 'සුත්ත නිපාත', 'උදාන', 'බ්‍රහ්මජාල සුත්ත' ආදි පොත් හින්දී බසට පරිවර්තනය කළ උන්වහන්සේ 'අභිධර්මාර්ථ සංග්‍රහය' ඉංග්‍රීසි බසට පරිවර්තනය කළහ. 'බෝධිනී මිලින්ද ප්‍රශ්න සමාලෝචනා', 'බුද්ධ ධර්මය (ඉංග්‍රීසි)', '(චීන) මිලින්ද ප්‍රශ්නය (ඉංග්‍රීසි)', 'දුක්ඛතත්ත්ව විවේචන (සංස්කෘත)' ආදි කෘති ගණනාවක්ද උන්වහන්සේ විසින් රචනා කරන ලදි. නාලන්දා පාලි පර්යේෂණායතනයේ අධිපති බවට පත් වූ මුන්වහන්සේ පාලි ත්‍රිපිටකය ඉන්දියානු රජයේ සහායෙන්

නාගරී අකුරින් මුද්‍රණය කරන්නට පුරෝගාමී වූහ. බෞද්ධ අධ්‍යයනය සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු කරන ඉන්දියානු විද්වතුන් නාගරී අකුරින් පළ කරන ලද මෙම පාලි ත්‍රිපිටකය භාවිත කරනු වර්තමානයේද දක්නට ලැබෙයි.

උත්තර භාරතයේ හින්දී භාෂක කලාපයට අයත් බිහාර් ප්‍රාන්තයේ මිථිලා ප්‍රදේශයට අයත් 'තරෞනී' නම් ගම්මානයේ උපත ලැබූ 'වෑද්‍යනාථ් මිශ්‍ර' නමැති සංස්කෘත පඬිවරයා රාහුල් පඬිතුමාගේ ආභාසයෙන් විද්‍යාලංකාරයට පැමිණ ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙතින් පැවිද්ද ලබා ත්‍රිපිටක ධර්මය හැදෑරුවෙකි. මෛථිලී සාහිත්‍යයේ 'යාත්‍රී' (ඇවිදින්නා) නමින් ප්‍රචලිත, අද්‍යතන හින්දී සාහිත්‍යයේ 'බාබා නාගාර්ජුන්' නමින් හැඳින්වෙන මෙම පඬිවරයා විසින් විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවා වදාළ රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්ථවිරපාදයන් වහන්සේ අපවත් වී 50 වසරක් පිරීම නිමිති කොට ගෙන 'ශ්‍රී ධර්මාලෝක ශතකය' සංස්කෘත බසින් ලියන ලදි. 1937 වසරේ අගෝස්තු මාසයේදී මේ ගුණානුස්මරණ උත්සවය පැවැත්විණි. එහිදී ශ්‍රී ධර්මානන්ද හිමිපාණන්ට ගෞරව කරමින් ලියූ එක් ශ්ලෝකයක් මෙසේය:

'විද්වාන්මිලින්දෛරභිවන්ද්‍යමානඃ - නමාම්‍යුපාධ්‍යාය පදාරවින්දම්
පාරෙ ස්ථිතානාමපි සාගරස්‍ය - යත්සෞරභං කර්ෂති මානසානි'


'පණ්ඩිතයන් නමැති බමරුන් විසින් වදිනු ලබන පාපියුම්වල සුවඳින් මුහුදින් එතර සිටින්නවුන්ගේ පවා සිත් ඇද ගනු ලැබේද, විද්‍යාලංකාර පරිවේණාධිපති ශ්‍රී ධර්මානන්දාභිධාන ඒ මාගේ උපාධ්‍යායන් වහන්සේගේ පා කමල් මම වදිමි.'

ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ කාලයේදී විශේෂ අමුත්තන් වශයෙන් විද්‍යාලංකාර පිරිවෙනට පැමිණි අය අතර ශ්‍රී ජවාහර්ලාල් නේහ්රූ, රබීන්ද්‍රනාථ් තාගෝර්, ශ්‍රී සර්වපල්ලි රාධාක්‍රිෂ්ණන් වැනි අය වූ බව සඳහන් වෙයි. 1945 පැවැති විද්‍යාලංකාර ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වී ඇත්තේද ශ්‍රී සර්වපල්ලි රාධාක්‍රිෂ්ණන්තුමාගේ ප්‍රධානත්වයෙනි.

මේ ආකාරයට විද්‍යාලංකාරයෙන් ඉමහත් ශාස්ත්‍රාලෝකයක් ලැබූ භාරතීය පඬිවරුන් සහ විද්වතුන් විසින් ශාස්ත්‍රීය ලෝකයට කරන ලද දායකත්වය අතිමහත් බව පැහැදිලිය. එමෙන්ම භාෂා-ධර්ම-ශාස්ත්‍ර ආදි විෂය ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධයෙන් භාරතයත්, ශ්‍රී ලංකාවත් අතර සෘජු ශාස්ත්‍රීය සබඳතා පවත්වා ගැනීමෙහි ලා විද්‍යාලංකාරයේ භූමිකාව කෙතරම් ප්‍රශංසනීයද යන්න මොනවට පැහැදිලි වෙයි.

**විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ**
**හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය,**
**සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය,**
**කොළඹ විශ්වවිද්‍යාලය**

.



## වෛශාලි හි ස්තූපය සහ අශෝක කුළුණ

බිහාරයේ වෛශාලි හි ස්තූපය හා අශෝක කුළුණ - බුදුන් වහන්සේ ජීවමාන කාලයේදී වෛශාලිය ඉතා විශාල සමෘද්ධිමත් නගරයක් විය. බුදුන් වහන්සේ අවස්ථා ගණනාවකදී ම වෛශාලි නුවරට වැඩම කළ අතර එය බුද්ධ චරිතය හා බැඳි වැදගත්ම ස්ථාන අතරින් එකකි.

# ශ්‍රී ලාංකේය බෞද්ධ ඥාන සම්ප්‍රදායයේ සීමා පුළුල් කළ මහා පණ්ඩිත රාහුල් සංස්කෘත්‍යායන පඬිතුමා

අග්ගමහා ග්‍රන්ථ වාචක පණ්ඩිත, මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි



මහා පණ්ඩිත් රාහුල් සංස්කෘත්‍යායන අතිශ්‍රේෂ්ඨ භාරත පුත්‍රයෙකි. මහාපඬිවරයෙකි. උපතින් කේදර්නාත් පාණ්ඩේ වූ ඔහු රාහුල් සංස්කෘත්‍යායන වූයේ ලංකාවේ දී ය. රාහුල් යන්න ඔහුට ලැබුනේ විද්‍යාලංකාර පරිවේණාධිපති ලුණුපොකුණේ ධම්මානන්ද නාහිමියන්ගෙනි. සංස්කෘත්‍යායන යනු ඔහුගේ ගෝත්‍ර නාමය යි.

රාහුල් සංස්කෘත්‍යායනගේ ඥානයේ ආලෝකයෙන් මෑත කාලීන ශ්‍රී ලාංකේය බෞද්ධ ඥාන සම්ප්‍රදායේ සීමා පළල් විය. ඔහු උපන්නේ 1893 දී ය. ඒ ඉන්දියාවේ උත්තර ප්‍රදේශ් හි බමුණු ගමක ය. බුදුදහම ඔහුගේ ජීවිතය වෙනස් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස පළමුවරට ඔහු 1927 දී ලංකාවට පැමිණියේය. ඔහුගේ අභිප්‍රාය වූයේ පාලි සහ බුදුදහම ඉගෙනීම යි. පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ ඒ සඳහා ඔහු තෝරාගත්තේය. 1931 දක්වා ඔහු එහි වාසය කළේය. එකල එහි පරිවේණාධිපති ධුරය දැරූ ලුණුපොකුණේ ධම්මානන්ද හිමියන්ගේ පැවිදි ශිෂ්‍යයකු බවට පත් ව ඉගෙනීම් කළේය. ඒ අතරේ පිරිවෙණෙහි ඉගැන්වීම් ද කළේය.

බුද්ධධර්මය සම්බන්ධයෙන් පුළුල් දැක්මක් තිබූ ඔහු ලුණුපොකුණේ නාහිමියන්ගේ ද ආධාර ඇතිව ටිබෙටය බලා ඉතා දුෂ්කර ගමනක යෙදී ඉතා වැදගත් බෞද්ධ පොත් රැසක් සොයාගෙන සංස්කරණය කොට අපට දායාද කළේය. ඒ අතර වැදගත්ම කෘති වන්නේ මහාතාර්කික ධර්මකීර්තිපාදයන්ගේ ප්‍රමාණවාර්තිකය යි. රාහුල් සංස්කෘත්‍යායන මහාපණ්ඩිතයාණන් නොසිටින්නට අදටත් එය බෞද්ධයන්ට දැකගන්නට හෝ නොලැබෙන්නට ඉඩ තිබිණ. ඥානය ලබාගැනීම සඳහා භාරතීය දර්ශනයන්හි නිර්දේශ කර තිබූ විවිධ ක්‍රම ප්‍රතික්ෂේප කොට අනුමානය හා ප්‍රත්‍යක්ෂය බුදුරජාණන් වහන්සේ නිර්දේශ කළහ. ඒ බව තාර්කිකව සනාථ කිරීමට දින්නාග හිමියන් සමත් වූ අතර උන්වහන්සේට නැගුණු විරෝධතා නිෂ්ප්‍රභ කරන්නට ධර්මකීර්ති හිමියෝ ප්‍රමාණවාර්තිකය රචනා කළහ.

සංස්කෘත්‍යායන වාර්තිකයක් ද ලියා සංස්කරණය කොට ලෝකයට ඉදිරිපත් කළේ එම කෘතිය යි. විද්‍යාලංකාර පිරිවෙණ විශ්වවිද්‍යාල මට්ටමට උසස් කළ අවස්ථාවේ දී උපකුලපති පදවියට පත් කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නාහිමියෝ දර්ශන අංශයේ මහාචාර්ය ධුරය ප්‍රදානය කොට රාහුල් සංස්කෘත්‍යායන පඬිවරයාගේ සේවය නැවතත් ලංකාවට ලබාගත්හ. 1959 සිට 1961 දක්වා එම ධුරය දරමින් ශ්‍රී ලාංකේය ඥාන සම්ප්‍රදායයේ නිම්වළලු පුළුල් කිරීමෙහි ලා මහත් කැපවීමෙන් ක්‍රියාකළහ.

විද්‍යාලංකාර පිරිවෙණෙහි සංස්කෘත උගන්වද්දී මෙන්ම විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙහි දර්ශනය උගන්වද්දී ද එතුමන්ගේ ඥානයෙහි ආලෝකයෙන් ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා භාෂාව, දර්ශනය හා සංස්කෘතිය පිළිබඳ නව දැක්මක් ගොඩනගා ගත්හ. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් මහාචාර්ය ජයදේව උයන්ගොඩ විසින් සිදුකර ඇත. එතුමා කියන පරිදි සංස්කෘත්‍යායන පඬිතුමා විද්‍යාලංකාර පිරිවෙණේ සංස්කෘත උගන්වද්දී එහි තිබුණු භාෂා ඉගැන්වීමේ සම්ප්‍රදායයන් යල් පැන ගිය එකක් බව වටහාගෙන ඒ සඳහා නව විධික්‍රමයක් හඳුන්වා දී සංස්කෘත ඉගැන්වීමේ පාඨග්‍රන්ථයක් ද සකස් කළේය. එතුමාගේ මේ නව විධික්‍රමය වූයේ ව්‍යාකරණ සූත්‍ර සහ සම්භාව්‍ය සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථ කටපාඩම් කරන ගමන්ම සංස්කෘත භාෂාවෙන් ඇති සාහිත්‍යමය හා දර්ශනවාදය පිළිබඳ කෘතීන් ද කියවා අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීම යි. මේ අනුව පැහැදිලි වන්නේ සංස්කෘත්‍යායන පඬිතුමා විද්‍යාලංකාර පිරිවෙණෙහි භාෂා අධ්‍යයනය පිළිබඳ නව ඉගැන්වීම් සම්ප්‍රදායක් බිහි කළ ආකාරය යි.

අනෙක් අතට එතුමා ටිබෙටයෙන් සොයාගෙන හා මූලසර්වාස්තිවාද සම්ප්‍රදායේ විනය ග්‍රන්ථයක් වන උපසම්පදාඥප්තිය නිසා ථේරවාද විනයෙහි සීමා වඩාත් පෘථුල වෙයි. මේ ඒ සඳහා නිදසුනකි. යම් කෙනෙක් උපසම්පදා කළ පසු ඔහු උපසම්පදා කළ වේලාව, දිනය ආදිය දැන්විය යුතුය. ඒ බව විනය පිටකයේ මහාවග්ගපාළියේ මහාක්ඛන්ධකයේ දැක්වෙයි. එහෙත් එය අපැහැදිලි ය. මූලසර්වාස්තිවාදීන්ගේ උපසම්පදාඥප්තියේ ඊට වඩා පැහැදිලි විස්තරයක් එයි. පාලි මහාවග්ගපාළියේ දී දැක්වෙන පරිදි යම් අයෙකු උපසම්පදා වූ පසු ඔහු උපසම්පදා වූ දිවසභාගය ඔහුට දැන්විය යුතු වේ. එහෙත් දිවසභාගය යන් කුමක්දැයි එහි විස්තර නොවේ.

උපසම්පදාඥප්තිය 'දිවසභාග' යන්න 'කාලය' ලෙස ගෙන දවසේ කාල භේදය දක්වා ඇත. 1. පූර්වාහ්නය, 2. මධ්‍යාහ්නය, 3. සායහ්නය, 4. රාත්‍රියේ ප්‍රථමාර්ධ යාමය, 5. මධ්‍යමාර්ධ යාමය, 6. පශ්චිමාර්ධ යාමය යනුවෙන් දවස හය කොටසකට බෙදා නැවතතත් ඒවායේ අනු කොටස් ද එහි දක්වා තිබේ. ථේරවාද සම්ප්‍රදායට වඩා සූක්ෂ්ම ලෙස දවස පිළිබඳව උපසම්පදාඥප්තියේ එන බෙදීම විනය පිළිබඳ සාම්ප්‍රදායික ඥානයේ සීමා වඩාත් පුළුල් කරයි.

1933/34 කාලයේ දී රාහුල් සංස්කෘත්‍යායන පඬිතුමා ටිබෙටයෙන් මෙම උපසම්පදාඥප්තිය සොයා නොගන්නට අපට මෙම විග්‍රහය කෙසේවත් නොලැබී යන්නට ඉඩ තිබිණ. සංස්කෘත්‍යායනට මෙම කෘතිය සංස්කරණය කරන්නට ඔහුට නොහැකි වුවත් ඔහු ජීවත්ව සිටිය දී 1961 දී ආචාර්ය කේ. කේ. දත්ත පැට්නාහි ජයස්වාල් පර්යේෂණ ආයතනයෙන් එය සංස්කරණය කළේය. එය අමෙරිකාවේ University of West හි Digital Buddhist Sanskrit Canon ව්‍යාපෘතියටත් රෝමන් හා නාගර (සංස්කෘත) අකුරුවලින් http://www.dsbcproject.org/ යන වෙබ් පිටුවේ පළකර ඇත. මෙහි වඩා නූතන සංස්කරණය 2011 වසරේ දී Jin-il Chung විසින් කොරියාවේ Joong-Ang Sangha විශ්වවිද්‍යාලයේ Institute for Buddhist Scriptures in Korean Translation නම් ආයතනයට සම්බන්ධව Handbuchfür die buddhisti sche Mönchs ordination bei den Mūlasarvāstivādins නමින් පළ කළ ලේඛනාගත සංස්කරණය යි. මෙයින් පෙනෙන්නේ රාහුල් සංස්කෘත්‍යායනගේ උත්සාහයේ ප්‍රතිඵල වර්තමාන ලෝකය තවමත් ලබමින් සිටින ආකාරය යි.

මා මෙතෙක් දැක්වූ ඉතා කෙටි විග්‍රහයෙන් පෙන්වා දෙන්නට උත්සාහ කළේ විසිවන සියවසේ උපන් ශ්‍රේෂ්ඨ භාරත පුත්‍රයෙකුගේ ඥානාලෝකයෙන් ශ්‍රී ලංකාවාසී අපගේ ඥානයේ සීමා පෘථුලව ගොස් ඇති ආකාරය යි. එසේ වූයේ ඒ මහාපණ්ඩිතයාණන්ගෙන් පමණක් නොවේ. භාරතයේ පහළ වූ අග්‍රගණ්‍ය මනුෂ්‍යරත්නය වූ බුදුරජාණන් වහන්සේගේ ඥානමහිමයෙන් සේම උන්වහන්සේගේ ශ්‍රාවක වූ මහාමහින්ද මහරහතන් වහන්සේගේ ඥානමහිමයෙන් ද ශ්‍රී ලංකාවාසී අපට ශිෂ්ටසම්පන්න ජීවන දර්ශනයක් ගොඩනගා ගන්නට හැකිවිය. බුද්ධඝෝෂ තෙරපාණන් ආදි අටුවා ඇදුරන්ගේ සේ ම කච්චායන, බුද්ධප්පියාදි ව්‍යාකරණඥයන්ගේ ද ඥානමහිමයෙන් ද අපි ඔපවත් වීමු.

අග්ගමහා ග්‍රන්ථ වාචක පණ්ඩිත,
මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය



2021 මාර්තු මාසයේ පැවති 'කපිලවස්තුපුර ශ්‍රී සර්වඥ ධාතු පුරාණය' කෘතිය එළිදැක්වීමේ උත්සවය



# පිරිතෙහි ඇති බලය

**අග්ගමහා පණ්ඩිත වල්පොළ පියනන්ද නාහිමි**

මීට වර්ෂ ගණනාවකට පෙර එනම් 1998 වර්ෂයේ දී ඇමරිකාවේ ඇරිසෝනා ප්‍රාන්තයේ තූසාන් නගරයේ වාසය කළ වික්‍රමසිංහ මහතා ඇතුළු දායක පිරිසක් වෙසක් උත්සවයක් පැවැත්වීමට ආරාධනා කළහ. මඩවල සීලවිමල හා වතෝගල සරණසිරි යන හිමිවරුන් සමඟ එම නගරයට ගොස් රාත්‍රී කාලයේ තායි පන්සලේ පිරිත් දේශනයක් කළෙමු. පසු දින උදයේ ශ්‍රී ලාංකික ඇන්ග්ලිකන් පූජකවරයෙක් වූ සිල්වා මැතිතුමා පැමිණ අප සිත් කම්පාකරන සිද්ධියක් ප්‍රකාශ කළේ ය. දහසය හැවිරිදි ඔහුගේ එකම පුත් “ලුකීඔයා” ක්ෂය රෝගය වැළදී රෝහලේ මරණ මංචකයේ සිටින බවත්, අපේ ආගමේ හැටියට කළ හැකි දෙයක් ඇත් නම් කරන ලෙසත් අයැද සිටියේය.

අප තිදෙනා ලෙඩා සිටින රෝහලට එවෙලේ ම පිටත්ව ගොස් පැයකට අධික කාලයක් පිරිත් කීවෙමු. මරණ මංචකයේ සිටි දරුවාට පිරිත් පැන් පොවා ආපසු තායි පන්සලට ආවෙමු. සවස දෙකට පමණ දරුවාගේ පියා වන සිල්වා පූජකතුමා පන්සලට පැමිණ අපට කියා සිටියේ දරුවා සැහෙන දුරට සනීප වී ඇති බවත්, ඔහු ඇඳෙන් නැගිට ආහාර ඉල්ලූ බවත්, එහිදී වෛද්‍යවරුන්ගේ උපදෙස් මත ආහාර ලබා දුන් බවත් ය. අවුරුදු කිහිපයකට පසුව නැවත මා තූසාන් නගරයට ගිය විට එදා අසනීප වී සිටි ළමයා නීරෝගී තරුණයෙක් වශයෙන් මා හමුවට පැමිණ ස්තුති කරමින් කියා සිටියේ ඔහුත් පවුලේ සැම දෙනාමත් පිරිතේ ශක්තියත් බලයත් පිළිගන්නා බවත්, අන්තර්ජාලයෙන් දිනපතා රතන සූත්‍රය අසන බවත් ය.

පිරිත් කීමෙන් ශාරීරික රෝග සුවපත් වන්නේ කෙසේ දැයි යමෙකුට සිතෙන්නට පුළුවන. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් අනුව අපගේ මනස ශරීරයට ඉතා සමීපව තදින් බැඳී තිබේ. උන්වහන්සේ පෙන්වා දුන්නේ කෙනෙකුගේ මානසික තත්ත්වය කෙනකුගේ භෞතික සුවතාවයට බලපාන බවයි. මනෝ විද්‍යාඥයෝ ද බුදුන් වහන්සේගේ මෙම දර්ශනය පිළිගනිති. ඔවුනට ඔප්පු වෙලා තිබෙන කාරණයකි, මනස සෙමින් වෙනස් වන විට ශරීරය සෙමින් වෙනස් වන බව. රොගී වූවෙකු ශුභවාදී නම් ඒ තැනැත්තාගේ ධනාත්මක සිතුවිලිවලින් ඔහු ඉක්මනට සුවපත් වේ. මේ බව පිළිකාවක් හැදී භාවනාවෙන් එය සුවපත් කරගත් වෛද්‍ය Ian Gaweer ලියන ලද YOU CAN CONQUER CANCER යන පොතේ විස්තර කොට ඇත.

පිරිත් දේශනා තුලින් බලාපොරොත්තු වන ප්‍රධාන කරුණු තුනක් ඇත.

01. ලෙඩ රෝග සුවපත් කර ගැනීම.

02. අමනුෂ්‍යයන්ගෙන් ඇති වන කරදර නැති කර ගැනීම.

03. ග්‍රහ තාරකාදියෙන් ඇති වන අපල උපද්‍රව නැති කර ගැනීම.

පිරිතේ බලශක්තිය ඇතිවන්නේ එහි ඇති සත්‍යය නිසාය (ඒතෙන සච්ච වජ්ජේන). එමෙන් ම පිරිත් දේශනා කරන්නාගේ හා අසන්නාගේ ඇති සීලය මේ සඳහා බලපායි. මෛත්‍රිය හා කරුණා ගුණයෙන් යුතුව පිරිත් දේශනා කළ යුතු අතර අසන්නා ශ්‍රද්ධාවෙන් යුතුව ඇසිය යුතුය. පිරිත් දේශනා කරන විට ඇතිවන ශබ්ද තරංග මාලාව රෝගියා සුව වීමට හේතු වේ. චිකාගෝවල සිටි වෛද්‍ය ලාල්

ප්‍රනාන්දු මහතා රෝගීන්හට පිරිත් ඇසීමට සැලසීමෙන් ඒ අය ඉක්මනින් සුවපත් වීමට හේතුවක් වූ බව පරීක්ෂණ මගින් ඔප්පු කර ඇත.

එදා විශාලා මහනුවර ඇති වූ රෝග, අමනුෂ්‍ය හා දුර්භික්ෂ යන තුන්බිය දුරුකිරීමට අපේ බුදුරජාණන් වහන්සේ රතන සූත්‍රය ආනන්ද මාහිමියන් ලවා පිරිත් පැන් ඉසිමින් දේශනා කරවන ලදී. එම රතන සූත්‍රයේ ඇති ගාථා දාහතෙන් මුල් ගාථා දෙකෙන් අමනුෂ්‍යයන් ඇමතීමක් කර ඇත. එහි ඇති ගාථා හතරකින් බුදු ගුණත්, ගාථා තුනකින් දහම් ගුණත් කියන අතර ගාථා අටකින් සහ ගුණ කියනු ලැබේ. ඊට හේතුව ශාසනය පවත්වාගෙන යනු ලබන්නේ මහා සංඝයා නිසාය.

පිරිත් දේශනයේ දී පිරිත් පැන්වලට විශේෂ තැනක් ඇත. වතුර නැතිව අපට ජීවත් වීමට නොහැක. එමෙන් ම වතුරට ශබ්දවල ශක්තිය ඇතුළත් කිරීමට හැකි බව ජපාන විද්‍යාඥයකු වූ Masaru Emoto ප්‍රකාශ කොට ඇති "“THE POWER OF WATER” යන පොතෙන් ඉතා හොඳින් පැහැදිලි කොට ඇත.

අපේ බුදුරජාණන් වහන්සේ එදා ආනන්ද හිමියන්ට හා අඟුලිමාල හිමියන්ට පෙන්නුම් කර දී ඇති පරිදි වතුරට පිරිත් කිරීමෙන් පසු ඇති බලය ශක්තිය ඉමහත් ය. ඒ නිසාමයි අපි එයට කියන්නේ පිරිත් පැන් කියා. සාමාන්‍ය බෝතලයක වතුර දින පසු වූ විට නරක් විය හැක. එහෙත් පිරිත් පැන් එසේ නරක් නොවේ. අප පාමංකඩ විහාරයේ අවුරුදු විස්ස තිහ පසු වී ඇති එහෙත් දිනපතා පිරිත් දේශනයට ඇති පැන් ලෙඩුන්ට දීමෙන් සුව වෙන බව දනිමි.

මේ දිනවල ලෝකයේ ඇති වී තිබෙන කොවිඩ් 19 වසංගතයෙන් බේරීමට විනය ගරුකව, වෛද්‍ය උපදේශ අනුගමනය කළ යුතු ය. සංවරය කියන්නේ හැදියාවයි. ඒ හැදියාව හැමට ම අවශ්‍යයි. ඒ සඳහා බුදුපියාණන් වහන්සේ පොදු ජනතාවට පෙන්නුම් කර දී ඇති මාර්ගය පංච ශීලයයි. පංච ශීලය නිසි පරිදි රකිනවා නම් අපට සතුටින් සමාදානයෙන් නීරෝගී මිනිසුන් හැටියට ජීවත්විය හැකි ය.

පින යනු තමන්ට කරදරයක් නොකරගෙන අනුන්ටත් කරදර නොකර ජීවත් වීමයි. (න අත්තබ්බාධාය හොති න පරබ්බාධාය හොති තං කුසලං කුසල විපාකං) පංච ශීලයේ දී පෙන්නුම් කරන පරිදි කෙනෙකුගේ ජීවිතය නැති කිරීමෙන්, හොරකම් කිරීමෙන්, කාමයේ වරදවා හැසිරීමෙන්, බොරු කීමෙන් හා සුරාපානයෙන් තම විනාශය මෙන් ම අනුන්ට කරදර හිරිහැර මෙන් ම අන් අයටත් පොදුවේ සියලු සමාජයටත් විනාශයක් කෙරේ. එය පවකි. එහෙයින් සංවර විනය ගරුක පුරවැසියෙකුගේ පරම වගකීම හා යුතුකම විය යුත්තේ පංච ශීලය හදවතට එකඟව හරියාකාරව රැක ගැනීමය. එහෙයින් ශ්‍රද්ධාවෙන් යුතුව උදේ සවස පිරිත් කිය යුතු අතර තම ආරක්ෂාව මෙන් ම අසල්වැසියාගේ ආරක්ෂාව ඇතිවන අයුරින් සංවරව කටයුතු කළ හොත් මේ භයානක වසංගත තත්ත්වයෙන් මිදීමට අපට හැකියාව ඇත.

**ඇමරිකාවේ ප්‍රධාන සංඝනායක,**
**ලොස් ඇන්ජලීස් නුවර ධර්මවිජය බෞද්ධ විහාරාධිපති,**
**අග්ගමහා පණ්ඩිත වල්පොළ පියනන්ද නාහිමි**



# ඉන්දු - ලංකා සබඳතා පුරාවිදු ඇසින්

මහාචාර්ය අනුර මනතුංග



ශ්‍රී ලංකාව ඉතිහාසය පුරා ම පැවතියේ භාරතයට පිටතින් පිහිටි ස්වාධීන රාජ්‍යයක් ලෙස ය. එය භාරතීය සම්ප්‍රදායට අනුව පාරසමුද්‍ර නැතහොත් මුහුදින් එතෙර පිහිටි වෙන ම භූමියක් ලෙස සලකනු ලැබී ය. එහෙත් සංස්කෘතියට අනුව ශ්‍රී ලංකාව මහා භාරතීය සංස්කෘතියේ ම කොටසක් බව කිව හැකි ය. මෙම සම්බන්ධතාව වඩාත් තීව්‍ර වන්නේ භාරතයෙන් මෙරටට බුදු දහම ලැබීම නිසා ය.

එසේ වුව ද භාරතය සමග ශ්‍රී ලංකාවේ සබඳතාව ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා ඈතට දිවෙන බව පුරාවිද්‍යාත්මක සාධක අනුව කිව හැකි ය. මෙරට ප්‍රාග් ඓතිහාසික සාධක බහුල ඉරණමඩු පාංශු සැකැස්ම හා දකුණු ඉන්දියානු ටේරි නම් වැලි කඳු අතර බොහෝ සාම්‍යයන් දැකිය හැකි ය. තව ද දකුණු ඉන්දියානු මෙගලිතික සංස්කෘතිය හා මෙරට මෙගලිතික සංස්කෘතිය අතර බොහෝ සමානකම් ඇත. ශ්‍රී ලංකාවේ බහුතර ජනවර්ගය වන සිංහලයන් උතුරු ඉන්දියාවේ සිට සම්මත වර්ෂ 6 වන ශතවර්ෂයේ දී මෙරටට සංක්‍රමණය වූ පිරිසකගෙන් පැවත එන බව සාම්ප්‍රදායික ඉතිහාසයේ සඳහන් ය. එම පිරිස ගුජරාටය, බෙංගාල සහ කාලිංග යන ප්‍රදේශ සමග බහුල වශයෙන් සබඳතා පැවැත් වූ බව පුරාවිද්‍යාත්මක හා වාර්තු විද්‍යාත්මක සාධක අනුව පෙන්වා දිය හැකි ය. මෙරට දෙවන ප්‍රධාන ජනවර්ගය වන ද්‍රවිඩ ජනතාව දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය, චෝල සහ කේරල යන ප්‍රදේශවලින් විටින් විට සංක්‍රමණය වූ පිරිස්වලින් සම්භවය ලැබුවෝ ය.

ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ඇතැම් මූලික ලක්ෂණ ද වෛදික සංස්කෘතියේ මූලිකාංග ද ශ්‍රී ලංකාවේ මුල් සංස්කෘතිය තුළ දැකිය හැකි ය. අශෝක අධිරාජ්‍යයාගේ ධර්ම විජය ප්‍රතිපත්තියට අනුව සම්මත වර්ෂයට පෙර 3 වන සියවසේ දී සිය පුත්‍රයා සහ දියණිය මෙරට එවමින් බුදු දහම මෙරට ස්ථාපනය කිරීම භාරතයෙන් ශ්‍රී ලංකාවට ලැබුණු විශාල ම දායාදය ලෙස හැඳින්විය හැකි ය.

පුරාවිද්‍යාඥයකු ලෙස සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් පුරාවිද්‍යා ක්ෂේත්‍රය සඳහා ඉන්දීය පුරාවිද්‍යාවෙන් ලැබුණු ආභාසය පිළිබඳව සඳහන් කිරීම මාගේ යුතුකමකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාරය, විශ්වවිද්‍යාල සහ මෙරට අනෙකුත් සියලු ම ශාස්ත්‍රීය පර්ෂදවල පුරෝගාමී ආයතනය වූයේ 1845 දී පිහිටුවනු ලැබූ රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාව ය. මෙය 1784 දී කල්කටාවේ පිහිටුවනු ලැබූ ආසියාතික සංගමයේ ශාඛාවක් විය. එමෙන් ම 1868 දී මුල් වරට මෙරට පුරාවිද්‍යා කොමිසමක් පිහිටුවීමට ප්‍රධාන හේතුව වූයේ එවකටත් ඇලෙක්සැන්ඩර් කනිංහැම් යටතේ ඉන්දියාවේ පුරාවිද්‍යා සමීක්ෂණ කටයුතු ආරම්භ කර තිබීමය. 1890 දී මෙරට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවීමේ දී ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණයේ ආභාසය ලබාගෙන ඇත. අප දෙපාර්තමේන්තුවේ ශිලාලේඛන සංග්‍රහය වන *Ephigraphia Zeylanica* සංග්‍රහය 1904 දී ආරම්භ කරනු ලැබුවේ ඉන්දියානු පුරාවිද්‍යා සමීක්ෂණය *Ephigraphia Indica* සංග්‍රහය අනුකරණය කරමිණි. එමෙන් ම අපගේ වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය වන *Ancient Ceylon* සඟරාව ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණයේ *Ancient India* අනුව නම් කරනු ලැබූවකි.

තව ද අපගේ කීර්තිමත් පුරාවිද්‍යාඥයකු වන සෙනරත් පරණවිතානයන් ඉන්දියාවේ පුහුණුව ලැබූ අතර ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණයේ දකුණු කවයේ ප්‍රධානියා වූ ලෝංහර්ට්ස් මහතා කලක් මෙරට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ද විය. මෙම ශුභාශිංසන ගෙනෙන මා ද මාගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ඉන්දියාවේ කීර්තිමත් පූනා විශ්වවිද්‍යාලයේ දී සිදුකළ බව මෙහි දී සඳහන් කර සිටින්නේ නිහතමානි ආඩම්බරයකිනි.

**මහාචාර්ය අනුර මනතුංග**

**පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්**



2021 මැයි මාසයේදී ඉන්දීය ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් ගංගාරාමයේ පැවති විශේෂ ආශිර්වාද වැඩසටහන

# Follow Us on

https://hcicolombo.gov.in/

/IndiaInSriLanka

@IndiainSL

/IndiainSL

@indiainsl